# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,911 — 1970 ජූනි 18 වැනි බ්‍රහස්පතින්දා — 1970.6.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 787 | තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 817 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 795 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... ... | 797 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 816 | විවිධ දැන්වීම ... ... ... ... | — |



## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන වන මුදලක් ඒ අර මුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පලවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පලකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පලකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---


787—B 69740— 5,071 (70/6)

7. නියමිත දිනයෙන් පසුව මේ කාර්යාලයට ලැබෙන ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

8. ඉල්ලුම්පත් හෝ තනතුර පිළිබඳ අනිකුත් ලිපි ඇත් නම්, ඒවා වැඩ බලන වන සංරක්ෂකට මිස මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුට පෞද්ගලිකව එවිය යුතු නොවේ.

ඩබ්. ආර්. එච්. පෙරේරා.
වැඩ බලන වන සංරක්ෂක.

1970 ජූනි 9 දින,
කොළඹ 2,
තැ. පෙ. 509,
වන සංරක්ෂකගේ කාර්යාලයේ දීය.

**ආකෘති පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.
2. ලිපිනය :———.
3 ලාංකිකයෙකු වනුයේ පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන් ද යනවග :———.
4. (අ) උපන් දිනය :———.
(ආ) 1970 ජූලි මස 4 දිනට වයස : අවුරුදු :—— මාස :——.
5. දැනට තනතුරක් දරන්නේ නම්, ඒ කුමක් ද ? :———.
6. අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද :———.
7. විශේෂ සුදුසුකම් ඇත් නම්, ඒවා දක්වන්න :———.

දිනය :———.

———,
අයදුම්කරුගේ අත්සන.

6–445—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### සහන නිවේදක තනතුරු—ස්වදේශීය සේවය

ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සහන නිවේදක (දෙමළ) තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අනියම් පදනමක් මත සේවයට බඳවාගනු ලබන අතර, දිනකට රු. 20 ක උපරිම සීමාවට යටත්ව පැයකට රු. 2.50 බැගින් ගෙවනු ලැබේ. ගමන් ගාස්තු හෝ වෙනත් දීමනා කිසිත් ගෙවනු නොලැබේ.

2. අයදුම්කරුවන් කෙටිකාලීන පුහුණුවක් ලැබිය යුතුයි. එම පුහුණුවීම හේතුවෙන් කිසිදු ගෙවීමක් කරනු නොලැබේ.

3. සහන නිවේදකයින් වශයෙන් සේවාව සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් මෙම ආයතනයේ ස්ථිර සේවකයන් නොවන අතර, අවශ්‍ය වන විට්දී පමණක් ඔවුන් සේවාවට කැඳවනු ලැබේ.

4. අයදුම්කරුවන් වයස අවුරුදු 18 ට වැඩි වියයුතු අතර, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් හෝ සමත්වූ අයවිය යුතුයි. සිංහල පිළිබඳ සාමාන්‍ය දැනුම අමතර සුදුසුකමක් වේ. ඉල්ලුම්කරුවන් ටොරිංටන් චතුරශ්‍රයේ පිහිටා ඇති ලංකා ගුවන් විදුලි සංස්ථා කාර්යාලයේ සිට සැතපුම් 6 ක සීමාව ඇතුළත වාසය කරන්නන් විය යුතුයි.

5. මෙම දැන්වීම අග ඇති නිදර්ශන ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1970 ජූනි මස 30 වෙනි දිනට පෙර ලැබෙනසේ කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ආකෘති පත්‍ර සපයනු නොලබේ. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවර "සහන නිවේදක තනතුරු (දෙමළ)" යන්න පැහැදිලිව සඳහන් කළයුතුයි.

6. ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

සුසිල් කුමාර මුණසිංහ.
අධ්‍යක්ෂ ජනරාල්,
ලංකා ගුවන් විදුලි සංස්ථාව.

1970 ජූනි මස 9 වැනි දින,
කොළඹ 7.

### නිදර්ශන ආකෘති පත්‍රය

**සහන නිවේදක තනතුරු (දෙමළ)**

(1) සම්පූර්ණ නම :———.
(2) ස්ථිර ලිපිනය :———
(3) උපන් දිනය සහ ස්ථානය :———.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
(4) 1970 ජූනි මස 30 වැනි දිනට වයස : අවුරුදු——, මාස :——
දින :——.
(5) ජාතිය :———.
(6) අධ්‍යාපනික සුදුසුකම් :———.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි)
(7) භාෂා පිළිබඳ ප්‍රවීණතාව :
(අ) දෙමළ :—
(ආ) සිංහල :—
(ඇ) වෙනත් භාෂා :—
(8) ගුවන් විදුලි ප්‍රචාරක සටහන් පිළිබඳ පළපුරුද්ද හා වෙනත් විශේෂ හිමිකම් පිළිබඳ විස්තර :———.
(9) සහතික පත් ලබාගත් අයගේ නම් හා ලිපින :———.
(සහතික පිටපත් ඇමිණිය යුතුයි)
(10) දැනට යෙදී සිටින හා කලින් යෙදුණ රැකියාවල් පිළිබඳ විස්තර දින සහිතව :———.

දිනය :———.

..................................................
අත්සන.

6–489—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## නෑදිමාල 'ඒ' ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති ධුරය

දෙහිවල ගල්කිස්ස නගර සීමාව තුළ පිහිටි නෑදිමාල උප තැපැල් කාර්යාලයට උප තැපැල් ස්ථානාධිපති වරයෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. අවම මාසික දීමනාව රු. 75 කි.

1. 70.7.18 වැනි දිනට ඉල්ලුම්කරුවන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම වයස අවුරුදු 21 ට වැඩි සහ අවුරුදු 45 ට අඩු ලාංකිකයන් විය යුතුය.

2. ඉල්ලුම්කරුවන් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක සිට නගර සභා ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. උප තැපැල් කාර්යාලය පිහිටි නගර සභා කොට්ඨාශය තුළ සහ යාබද කොට්ඨාශවල පදිංචි අයදුම්කරුවන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

3. ඉල්ලුම්කරුවන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ඩිලිස් ගණිතය ඇතුළුව අඩු වශයෙන් විෂයයන් තුනකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික විභාගය/අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය සමත් වී තිබිය යුතුයි.

4. නෑදිමාල උප තැපැල් කාර්යාලය පවත්වාගෙන යෑමට සුදුසු ගොඩනැගිල්ලක් කුලී රහිතව ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි.

5. කොළඹ 1, ඇල්ලන් චතුරශ්‍රයේ අංක 5 දරණ ගොඩනැගිල්ලේ පිහිටි (බටහිර දකුණ) කොට්ඨාශයේ ප්‍රාදේශීය තැපැල් අධිකාරී තුමාගෙන් ඉල්ලුම් පත් සඳහා මුද්‍රිත ෆෝර්ම ලබාගෙන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 70.7.18 වැනි දින හෝ ඊට පූර්වම ඔහු වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

තවදුරටත් විස්තර අවශ්‍ය නම් ප්‍රාදේශීය තැපැල් අධිකාරී තුමාගෙන් ලබාගත හැක.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ අධ්‍යක්ෂ.

6–382—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## ද සොයිසා වත්ත "බී" ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති ධුරය

දෙහිවල ගල්කිස්ස මහ නගර සීමාව තුළ ටෙම්ප්ලර්ස් පාරේ යහදර මාවත හන්දිය අසල "ද සොයිසාවත්ත" නමින් උප තැපැල් කාර්යාලයක් විවෘත කිරීමට නියමිතව ඇති හෙයින් එහි උප තැපැල් ස්ථානාධිපති ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. අඩුම මාසික දීමනාව රු. 50 කි.

1. 70.7.18 වැනි දිනට ඉල්ලුම්කරුවන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට වයස අවුරුදු 21 ට වැඩි සහ අවුරුදු 45 ට අඩු ලාංකිකයන් විය යුතුය.

2. ඉල්ලුම්කරුවන් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක සිට නගර සභා ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. උප තැපැල් කාර්යාලය පිහිටි නගර සභා කොට්ඨාශය තුළ සහ යාබද කොට්ඨාශවල පදිංචිකරුවන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

3. ඉල්ලුම්කරුවන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/මූලික ගණිතය ඇතුළුව අඩු වශයෙන් විෂයයන් තුනකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික විභාගය/අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය සමත් වී තිබිය යුතුයි.

4. ද සොයිසා වත්ත උප තැපැල් කාර්යාලය පවත්වාගෙන යෑමට සුදුසු ගොඩනැගිල්ලක් කුලී රහිතව ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි.

5. කොළඹ 1, ඇට්ලන් චතුරශ්‍රයේ අංක 5 දරණ ගොඩනැගිල්ලේ පිහිටි (බටහිර දකුණ) කොට්ඨාශයේ ප්‍රාදේශීය තැපැල් අධිකාරි තුමාගෙන් ඉල්ලුම් පත් සඳහා මුද්‍රිත පෝරම ලබාගෙන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 70.7.18 වැනි දින හෝ ඊට ප්‍රථම ඔහු වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

තවදුරටත් විස්තර අවශ්‍ය නම් ප්‍රාදේශීය තැපැල් අධිකාරි තුමාගෙන් ලබාගත හැක.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ
අධ්‍යක්ෂ.

6–383—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## කිරුල පාර "ඒ" ශ්‍රේණියේ උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති ධුරය

කොළඹ 5, කිරුළ පාර, උප තැපැල් කාර්යාලයට උප තැපැල් ස්ථානාධිපති වරයෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. අඩුම මාසික දීමනාව රු. 75 කි.

1. 70.7.18 වැනි දිනට ඉල්ලුම්කරුවන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම වයස අවුරුදු 21 ට වැඩි සහ අවුරුදු 45 ට අඩු ලාංකිකයන් විය යුතුය.

2. ඉල්ලුම්කරුවන් අවුරුදු 10 ක් හෝ ඊට වැඩි කාලයක සිට නගර සභා ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. උප තැපැල් කාර්යාලය පිහිටි නගර සභා කොට්ඨාශය තුළ සහ යාබද කොට්ඨාශවල පදිංචිකරුවන් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

3. ඉල්ලුම්කරුවන් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/මූලික ගණිතය ඇතුළුව අඩු වශයෙන් විෂයයන් තුනකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික විභාගය/අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය සමත් වී තිබිය යුතුයි.

4. කිරුල පාර උප තැපැල් කාර්යාලය පවත්වාගෙන යෑමට සුදුසු ස්ථානයක් නාරාහේන්පිට නව කම්කරු ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙන් සපයන අතර එහි කුලිය තෝරා පත් කරගන්නා උප තැපැල් ස්ථානාධිපති විසින් ගෙවිය යුතුයි.

5. කොළඹ 1, ඇට්ලන් චතුරශ්‍රයේ අංක 5 දරණ ගොඩනැගිල්ලේ පිහිටි (බටහිර දකුණ) කොට්ඨාශයේ ප්‍රාදේශීය තැපැල් අධිකාරි තුමාගෙන් ඉල්ලුම් පත් සඳහා මුද්‍රිත පෝරම ලබාගෙන සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් 70.7.18 වැනි දින හෝ ඊට ප්‍රථම ඔහු වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

තවදුරටත් විස්තර අවශ්‍ය නම් ප්‍රාදේශීය තැපැල් අධිකාරි තුමාගෙන් ලබාගත හැක.

වර්නන් ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සන්දේශ
අධ්‍යක්ෂ.

6–381—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ ගුදම්කරු තනතුර

රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ ගුදම්කරු තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව, පිළියෙල කර ගත් ඉල්ලුම් පත්‍ර 1970.7.7 වැනි දින හෝ ඊට පෙර හෝ "රජයේ සැපයීම් අධ්‍යක්ෂ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව, තැ. පෙ. 418, කොළඹ 2" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් උඩ කෙළවරේ "ගුදම්කරු තනතුර" යන්න ලිවිය යුතුයි.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අයත් ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය : රු. 3,864—18×144—6,456 කි. (කල්පිත වැටුප : රු. 1,620—18×120—3,780).

3 **සේවයෙහි යෙදවීමේ නියමයන්.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

4 **අවශ්‍ය සුදුසුකම් :**

(i) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය ඇතුළු විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය.

(ii) බඩු ඇසිරීම හා බඩු යැවීම පිළිබඳව සැලකිය යුතු පුහුණුවක් තිබිය යුතුය.

**සංලක්ෂ්‍යය :** කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හිමි අවුරුදු 5 කට නො අඩු සේවා කාලයක් ඇති දැනටමත් රාජ්‍ය සේවයේ සිටින ඉහත (ii) කොටසේ සඳහන් සුදුසුකම් ඇති නිලධාරීන්ට ද මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය.

(iii) අයදුම්කරුවන් 1970.7.7 දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. දැනට රජයේ සේවයේ සිටින අයට මෙය බලපවත්වන්නේ නැත.

5. **සේවා කොන්දේසි :**

(අ) රාජ්‍ය භාෂා පනතේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම්—

(i) ආධුනික කාලසීමාව අවුරුදු තුනක් විය යුතුයි.

**සංලක්ෂ්‍යය :** ස්ථිර නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් නියමිත කාලයකට බැඳ බැලීමට ඔහු පත් කළ හැකිය.

(ii) ඔහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධි විධානයන් ක්‍රියාවට නැගීම පිණිස ද, සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන යම් යම් ව්‍යවස්ථාවනට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(iii) ආධුනික කාල සීමාව ඇතුළත ඔහු විසින් සිංහල භාෂාව විෂයයෙහි ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය.

(iv) ආධුනික කාල සීමාව අවසානයේදී තනතුරෙහි ස්ථිර කිරීම වෙනත් කරුණු අතර නියමිත කාල සීමාවක් ඇතුළතදී නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණ වලින් සමත්වීම ද මත රඳා පවතිනු ඇත. නියමිත කාල සීමාව තුළදී මෙම ප්‍රවීණතා වලින් සමත් වීමට අපොහොසත් වීම, වැටුප් වැඩිවීම අත්හිටුවනු ලැබීමට හේතුවන අතර, නියමිත කාල සීමාව ඉක්මවා තවත් සමසක් ඇතුළතදී පරීක්ෂණයකින් සමත් නොවූවහොත් එම "අත්හිටවීම" නතර කිරීමකට පරිවර්තනය කර, පරීක්ෂණයෙන් සමත්වන තෙක් එම නතර කිරීම ක්‍රියාත්මකව තබනු ඇත.

(v) ආධුනික කාල සීමාව අවසාන වීමට පෙර, සිංහල භාෂා විෂයයෙන් නියමිත තත්ත්වයේ ප්‍රවීණතාවක් ලබාගෙන නොතිබුණ හොත් අංක 120 සහ 121 දරණ පාලන රෙගුලාසි වල විධි විධාන බලපවත්වනු ඇත.

(ඉහත දැක්වෙන (iii), (iv) සහ (v) දරණ කොන්දේසි, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් බඳවාගනු ලබන්නන්ට අදාල වෙයි.)

(ආ) (i) තෝරාගත් අයදුම්කරු දිවයිනේ කවර පළාතක වුවද සේවය කළ යුතුයි.

(ii) ඔහු විසින් මුදලින් රු. 1,000 ක ඇපයක් තැබිය යුතුයි.

6. **කාර්යක්ෂමතා කඩ ඉම්.**—තනතුරෙහි ස්ථිර කරනු ලැබූ දින සිට, දෙවර්ෂයක් ඇතුළතදී ඔහු සිංහල භාෂා විෂයයෙන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ, නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත් විය යුතුය. මෙම විභාගයෙන් සමත් වීමට අපොහොසත් වීම, වැටුප් වැඩිවීම පමා කරනු ලැබීමට හේතුවනු ඇත.

7. **අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් වලට අමුණා එවිය යුතු පිටපත්.**—(මුල් පිටපත් නොවේ).

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු පිණිස නිකුත් කර ඇති සහතික පිළිගනු නොලැබේ).

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්. (දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් මෙම ඡේදයෙහි සඳහන් චරිත සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ).

8. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගේ අයදුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. නියම දිනයට පසු එවන එවැනි අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට නියම දිනට හෝ ඊට පෙර ඉල්ලුම් පත් ලැබී, ප්‍රමාදය සඳහා සැළකිය යුතු කාරණා ඉදිරිපත් කර දෙපාර්තමේන්තු ප්‍රධානියා නිර්දේශ කළහොත් පමණක්, යථෝක්ත ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාර ගනු ලැබේ.

9. මෙම ගැසට් නිවේදනයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් තනතුරුවලට කරන පත් කිරීම් පිළිබඳ හා පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970 ක්වූ ජුනි මස 18 දින,
කොළඹ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේදීය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ ගුදම්කරු තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)
(අ) පෙළපත් නාමය :————.
(ආ) අනෙකුත් නම් :————.

2. ලිපිනය :
(අ) පෞද්ගලික :————.
(ආ) කාර්යාලයීය :————.

3. 1970.7.7 දිනට ඉල්ලුම්කරුගේ වයස :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)

4. (අ) ලංකාවේ පුරවැසියෙක් දැයි සඳහන් කරන්න :————.
(i) පරම්පරාවෙන් ද ? :————.
(ii) ලියාපදිංචි කිරීමෙන් ද ?

(ආ) උපන් ස්ථානය :
(i) අයදුම්කරු :————.
(ii) අයදුම්කරුගේ පියා :————.
(iii) අයදුම්කරුගේ පිය පක්ෂයේ පියා :————.

සංලක්ෂ්‍යය : අයදුම්කරු සහ ඔහුගේ පියා ලංකාවේ උපන් අයවලුන් වේ නම් (i) සහ (ii) පමණක් පිරවිය යුතුය. අයදුම්කරු හෝ ඔහුගේ පියා ලංකාවේ උපන් අය නොවේ නම් (i), (ii) සහ (iii) පිරවිය යුතුය.

5 අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් :
(අ) සාමාර්ථය ලද උසස්ම විභාගය :————.
(විභාග සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
(ආ) පළපුරුදුකම් :————.
(පළපුරුදුකම් පිළිබඳ සහතික පිටපත් ඇමිණිය යුතුය)
(ඇ) තනතුරට අදාල වෙනත් සුදුසුකම් ඇතොත් සඳහන් කරන්න :————.

6. චරිත සහතික ලබා ගත්තේ කාගෙන් ද යන වග සහ ලිපිනය :
————.

මම, ඉහත සඳහන් කර ඇති විස්තර නිවැරදි හා සත්‍ය ඒවා බව සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි සහගත යයි ඔප්පු වුවහොත් තෝරා පත් කර ගැනීමට පෙර මා නුසුදුසු වීමටත්, පත් වීමෙන් පසුව එම ප්‍රමාද දෝෂය අනාවරණය වුවහොත්, කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමටත් යටත් වන බව මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

6–874—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## ගාල්ල දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුව උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩුගම ගම්කාර්ය සහා ප්‍රදේශයට හදිසි මරණ පරීක්ෂකවරයෙකු පත්කිරීම

ගාල්ල දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තුව උතුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩුගම ගම්කාර්ය සභා ප්‍රදේශය තුළ හදිසි මරණ පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘතියේ ප්‍රකාර ඉල්ලුම්පතක් සකස් කොට වර්ෂ 1970 ක්වූ ජුනි මස 30 වන දින පස්වරු 3 ට හෝ ඊට ප්‍රථම ගඟබඩපත්තුව උතුරේ ප්‍රාදේශීය ආදායම් නිලධාරීට ලැබෙන්ට ඔහුගේ පහත සඳහන් ලිපිනයට යැවිය යුතුය.

"ප්‍රදේශීය ආදායම් නිලධාරි, ගඟබඩ පත්තුව උතුර, නාගොඩ"

2. මෙම තනතුර නිර්වේතන වේ. එහෙත් මරණ පරීක්ෂණය සඳහා එකකට රු. 7.50 ක් බැගින් දීමනාවක් ගෙවනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත වීම.

(ආ) ගාල්ල දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුවේ උතුර ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ උඩුගම ගම්කාර්ය සභා කොට්ඨාශ සීමාව තුළ ස්ථිර පදිංචියක් තිබීම.

(ඉ) (i) 1925 සහ 1944 අතර තුර කාලයෙහි පාඨශාලා හැරයාමේ සහතික පත්‍ර විභාගයෙන් හෝ සිංහල භාෂාව සහිතව අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්, හෝ

(ii) සිංහල භාෂාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් හෝ සමර්ථ වී ඇති බවට සෑහෙන සහතික ඉදිරිපත් කළ යුතුයි.

(ඊ) රජයේ හෝ පළාත් පාලන ආයතනවල සේවකයින් නොවිය යුතුයි.

(උ) පළාත් පාලන ආයතනවල නියෝජිතයින් නොවිය යුතුයි.

(ඌ) ඉල්ලුම් පත්‍ර භාරගන්නා දිනට (70.6.30) වයස අවුරුදු 30 ට නොඅඩු හා 60 ට නොවැඩි විය යුතුයි.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. ඉල්ලුම්පත්‍ර ලැබුන බව දන්වනු නොලැබේ.

පී. ඒ. පී. ගුණසිංහ,
ගාල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970.5.15.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

## ගාලු දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුව උතුර ප්‍රදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩුගම ගම්කාර්ය සභා ප්‍රදේශයට හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ නම සහ ලිපිනය (පැහැදිලි අකුරින්) :———.
   අගට යෙදෙන නම :———.
   අනෙක් නම් :———.
2. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :———.
3. වර්ෂ 1969 ජූනි මස 30 දිනට වයස :
   අවුරුදු :———. මාස :———, දින :———.
4. විවාහක හෝ අවිවාහක භාවය :———.
5. අධ්‍යාපනික සුදුසුකම් :———.
6. දැනට කරන රක්ෂාව :———.
7. ණය කරදර තිබේද ? එසේ නම් ඒ පිළිබඳ විස්තර :———.
8. තමා සතු දේපළවල වටිනාකම හා ප්‍රමාණය :———.
9. ඉල්ලුම්කරු කිසිම චෝදනාවකට අධිකරණය මගින් දඬුවම් ලබ තිබේද ? :———.
10. මෙ තනතුර සඳහා වෙනත් හිමිකම් පිළිබඳ විස්තර :———.
11. මීට පෙර රැකියාවක් කළේද, එසේ නම් ඒ පිළිබඳ විස්තර : ———.
12. පළාත් පාලන ස්ථානයක නියෝජිතයෙකුද ? :———.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

6–366—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## ලංකා විදේශ දූත මණ්ඩලවල ඇබෑර්තු

### ලිපිකරු තනතුරු—සාමාන්‍ය ලිපිකාර සේවය

අංක 14,903 හා 1970 අප්‍රේල් 24 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පතේ උක්ත කරුණ සම්බන්ධයෙන් පළවූ දැන්වීම හා සම්බන්ධවයි.

එම තනතුර සඳහා අයදුම් පත් බාරගැනීමේ දිනය 1970 ජූනි 30 වන දින දක්වා මෙයින් දීර්ඝ කරනු ලැබේ.

සී. ගුණසිංහම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය,
සෙනෙට් මන්දිරය,
කොළඹ 1,
1970 ජූනි 5 දින.

6–351—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## ලංකා විදේශ දූත මණ්ඩලවල ඇබෑර්තු

### ලඝු ලේඛක තනතුරු

අංක 14,904 හා 1970 අප්‍රේල් 30 දින දරණ ගැසට් පතේ උක්ත කරුණ සම්බන්ධයෙන් පළවූ දැන්වීම හා සම්බන්ධවයි.

එම තනතුරු සඳහා අයදුම්පත් බාරගැනීමේ දිනය 1970 ජූනි 30 වන දින දක්වා මෙයින් දීර්ඝ කරනු ලැබේ.

සී. ගුණසිංහම්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙනුවට.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය,
සෙනෙට් මන්දිරය,
කොළඹ 1,
1970 ජූනි 5 දින.

6–352—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව

### මට්ටක්කුලියේ මධ්‍ය ගබඩාවේ ප්‍රධාන ගබඩා නිලධාරි තනතුර

වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම්පත් ලියාපදිංචි කළ තැපැලෙන් 1970 ජූලි මස 4 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, කොළඹ 1, මිලර්ස් ගොඩනැගිල්ලේ සිව්වැනි මාලයේ පිහිටි වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙත එවිය යුතුයි.

1. **අවශ්‍ය සුදුසුකම්.**—(අ) වයස් සීමාව : 1970 ජූලි මස 4 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (දෙපාර්තමේන්තු අපේක්ෂකයින් සඳහා මෙම වයස් සීමාව බල පවත්වන්නේ නැත.)

(ආ) **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී ලබාගත් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු (සාමාන්‍ය) සහතිකය හෝ ඊට වඩා උසස් විභාගයකින් සාමාර්ථය, සහ

(i) රබර් වගා කිරීම පිළිබඳව මනා දැනුමක් සහිතව, ලංකාවේ අපනයන වෙළඳ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ/හෝ වර්ග කිරීම පිළිබඳව 15 වසරක පළපුරුද්ද,

හෝ

(ii) රබර් පමණක් නිෂ්පාදනයෙහි සහ/හෝ වර්ග කිරීමෙහි 15 වසරක පළපුරුද්දක් තිබිය යුතුය ;

(iii) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්තව සිටිය යුතුය.

**සංලක්ෂ්‍යය.**—කණිෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ඊට සමාන සුදුසුකමක් හෝ ඇති දෙපාර්තමේන්තු අපේක්ෂකයින්, ඉහත 1 (ආ) (i) හෝ (ii) වැනි ඡේදයෙහි නියමිත සුදුසුකම් ඇතොත් අයදුම් කිරීමට සුදුස්සෝ වෙති.

2. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට අදාල ඒකාබද්ධ වැටුප් පරිමාණය : වර්ෂයකට රු. 6,600—8 × 180—රු. 8,040 වේ.

3. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති.**—මෙම තනතුර තාවකාලිකය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **සේවා කොන්දේසි.**—(අ) තෝරාගනු ලැබූ අපේක්ෂකයා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු නම්—

(i) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය ඔහු පිළිගත යුතුය.

(ii) ඔහුගේ පත්වීම කලින් නතර නොකරනු ලැබුවහොත් පත්වීමේ දිනයේ සිට පිළිවෙලින් අවුරුද්දක්, අවුරුදු 2 ක් සහ අවුරුදු 3 ක් ඇතුළත I වැනි ශ්‍රේණියේ, II වැනි ශ්‍රේණියේ සහ III වැනි ශ්‍රේණියේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන් ගෙන් සමත්වන ලෙස ඔහුට නියම කරනු ලැබේ.

නියමිත කාල පරිච්ඡේදය තුළදී පරීක්ෂණයකින් සමත් නොවුවහොත්, එය වැටුප් වැඩිවීම් අත්හිටුවීමට හේතුවේ. නියමිත කාල පරිච්ඡේදයෙන් පසු, තවත් හයමසක් ඇතුළත පරීක්ෂණයෙන් සමත් නොවුවහොත්, වැටුප් වැඩිවීම අත්හිටුවීම, වැටුප් වැඩිවීම නතර කිරීමකට පරිවර්තනය කර, පරීක්ෂණයෙන් සමත්වන තෙක් එම නතර කිරීම ක්‍රියාත්මකව තබනු ඇත. අවුරුදු 3 ඉක්මවා ඔහු සේවයෙහි නියුක්ත කොට තබා ගැනීම III වැනි ශ්‍රේණියේ පරීක්ෂණයෙන් සමත්වීම මත රඳා පවතිනු ඇත. කෙසේ වෙතත්, මේ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමෙන් ඔහුට දිගටම සේවයේ රැඳී සිටීමට අවසර දෙනු ලබන බවත් අවශ්‍යයෙන්ම අදහස් නොකෙරේ.

(iii) රාජ්‍ය නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත ප්‍රකාර විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් නියම කරනු ලබන ආකාරයට, නියම කරනු ලබන මුදලකින් ඇපයක් තබන ලෙස තෝරාගනු ලැබූ අපේක්ෂකයාට නියම කරනු ලැබිය හැකිය.

(ආ) ස්ථිර තනතුරක ඒ වන විටත් ස්ථිර කරනු ලැබ සිටින නිලධාරියෙකු අළුත් තනතුරකට පත් කරනු ලබන්නේ නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ වැඩ බැලීමේ පදනමක් මතය. අංක 574 සහ 1962. 4. 6 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය බලන්න.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය. (සැ. යු.—බෞතීස්ම සහතික හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ පිළිගනු නොලැබේ.)

(ආ) උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඇ) රබර් නිෂ්පාදනය සහ/හෝ වර්ග කිරීම පිළිබඳ පළපුරුදුකමට අදාල සහතික.

(ඈ) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අපේක්ෂකයන් විසින් චරිත සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

6. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ පළ කර ඇති රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

පී. පද්මනාදන්,
වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ කොමසාරිස්.

1970 ජූනි මස 2 දින,
තැ. පෙ. අංක 147,
කොළඹ 1, මිලර්ස් ගොඩනැගිල්ලේ,
වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුවේ දීය.

### ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

**මට්ටක්කුලියේ මධ්‍ය ගබඩාවේ ප්‍රධාන ගබඩා නිලධාරි තනතුර**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
   (අ) පෙළපත් නම :————.
   (ආ) අනික් නම් :————.
2. ලිපිනය :————.
3. (අ) ජාතිය :————.
   (ආ) ඔබ ලංකාවේ පුරවැසියෙක්ද යන බව සඳහන් කරන්න :
      (i) පරම්පරාවෙන්ද :————.
      (ii) ලියාපදිංචි කිරීමෙන්ද :————.
4. (අ) උපන් දිනය සහ 1970. 7. 4 දිනට තියම්ත වයස :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)
   (ආ) විවාහකද අවිවාහකද යන වග :————.
5. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් හා සමත් වූ විෂයයන් (දිනයන් සමග) :————.
6. ඉගෙන ගත් පාසැල හා පාසැලෙන් අස්වූ දිනය :————.
7. නිවේදනයේ 1 (ආ) (i) හෝ (ii) ඡේදයෙහි යොමු කළ පළපුරුද්ද පිළිබඳ විස්තර :————.
   (එම පළපුරුද්ද තහවුරු කිරීම සඳහා සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
8. කියවීම, ලිවීම, කථා කිරීම හා අර්ථ නිරූපනය පිළිබඳ සිංහල ප්‍රවීණතාව :————.
9. පාසැලෙන් අස් වූ දා සිට කළ රැකියාවන් හා ඒ සම්බන්ධවූ සේවා හා දිනයන් පිළිබඳ විස්තර :————.
10. චරිත සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනයන් (එම සහතික පත්‍රවල මුල් ලිපි නොව, පිටපත් ඉල්ලුම්පතට ඇමිණිය යුතුය) :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමි. මෙහි යම්කිසි අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව මා තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සෙකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ ඇති බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6-475 —70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### III ශ්‍රේණියේ ලිපිකරු තනතුර

රාජ්‍ය දැව සංස්ථාවේ ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

වැටුප් ක්‍රමය.—මසකට රු. 300—රු. 45×10—රු. 750.
(සියලු දීමනාවන් ඇතුළුව)

වයස.—1970.6.30 වැනි දිනට අවුරුදු 35 ට අඩුවිය යුතුය.

සුදුසුකම්.—අංක ගණිතය, වාණිජ අංක ගණිතය, හෝ ශුද්ධ ගණිතය යන විෂයකින් සම්මාන සාමාර්ථ්‍යයක් සහිතව, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ දෙවරකට නොවැඩි වාර ගණනකදී ලබා ගත් විෂයයන් හයකින් යුත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ)

**සමග**

රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක සැපයීම් අංශයක අවුරුදු 5 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුයි. (සැපයීම් කටයුතු, වෙන්ඩර් ක්‍රියා පිළිවෙල, වාණිජ සහ ආනයන වැඩ පිළිබඳ සෑම අංශයක් ගැනම මනා දැනුමක් තිබිය යුතුයි.) යතුරු ලේඛනය දැන සිටීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

**සාමාන්‍ය :**

(1) රජයේ සේවයෙහි හා රජයේ සංස්ථාවල සේවය කරන අයදුම්කරුවන් ගේ අයදුම් පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවල හා සංස්ථාවල ප්‍රධානීන් මගින් එවිය යුතුය. ඔව්හු සංස්ථාවේ සේවයට ස්ථිරව බැඳිය යුතු අතර ඔවුන් නිදහස් කළ හැකි බවත් එසේ කළ හැකි දිනයත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා සංස්ථා ප්‍රධානීන් විසින් සඳහන් කළ යුතුය.

(2) තෝරා ගනු ලබන අයදුම්කරු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන්ට අනුකූලව හා රජයේ හා රජයේ සංස්ථාවල සේවකයින්ට අදාළ රජයේ භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධ අනිකුත් කොන්දේසි වලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(3) අයදුම් පත් "සේවක කළමනාකාර, රාජ්‍ය දැව සංස්ථාව, 30, අශෝක උයන, කොළඹ 4" යන ලිපිනයට 1970.6.30 දිනට පෙර ලබෙන්නට ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. අයදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

සේවක කළමනාකාර,
රාජ්‍ය දැව සංස්ථාව.

30, අශෝක උයන,
කොළඹ 4,
1970 ජූනි 1 දින,

6-479—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඊආ/5/345

## අධ්‍යාපන අමාත්‍යාංශය

### පොත් ප්‍රකාශන කළමනාකාරිත්වය පිළිබඳ යුනෙස්කෝ පුහුණු පාඨමාලාව

පොත් ප්‍රකාශන කළමනාකාරිත්වය පිළිබඳ පුහුණු පාඨමාලාවක් අනුගමනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන යටතේ පිරිනැමෙන අධිශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම සාමූහික පාඨමාලාව 1970 අගෝස්තු 30 වැනිදා සිට සැප්තැම්බර් 26 වැනිදා දක්වා ඉන්දියාවේ නවදිල්ලියේදී පැවැත්වේ.

සහභාගිවන්නන්ගේ වෘත්තීය කෞශල්‍යය සහ ප්‍රකාශන පිළිබඳ සාමාන්‍ය දැනීම දියුණු කර සිය රටවල පොත් ප්‍රකාශන කර්මාන්තය සංවර්ධනය කිරීමෙහිලා යොමු කරවීම මේ පාඨමාලාවේ අදහස වන්නේ ය.

සහභාගිවන්නන් ලෙස අපේක්ෂා කරනුයේ, පොත් ප්‍රකාශන ආයතනයන්හි කළමනාකාර අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ වැනි වැදගත් කළමනාකාර තත්ත්වයන්හි කටයුතු කරන්නන් ය. ඔවුන් වාණිජ ස්වරූපයක නොවන පාඨ පුස්තක සහ ප්‍රවෘත්තිමය ප්‍රකාශන පිළිබඳව කටයුතු කරන්නන්ම නොව, සාමාන්‍ය වෙළඳ පොත් පිළිබඳව වාණිජ මය වශයෙන් ප්‍රකාශන කටයුතුවලට සම්බන්ධ අය විය යුතුය. එසේම එදිනෙදා කටයුතු පමණක් මෙහෙයවන්නන් නොව, අනාගත ක්‍රියා වලියන් සැලසුම් කරන්නන්ද විය යුතුය. (ප්‍රකාශන කටයුතු සැලසුම් කිරීම පිළිබඳව පාඨමාලාවේ වැඩි අවධානයක් ඇති හෙයිනි.) පාඨමාලා වෙන් ලැබෙන දැනීම, වාර්තා, දේශන හා දේශීය පුහුණු පාඨමාලා මගින්, තමන් යටතේ සේවය කරන අයටද පත් කිරීමට පුළුවන් කම ඔවුනට තිබිය යුතුය.

පාඨමාලාව, සිද්ධාන්තික පාඩම්, ප්‍රායෝගික වැඩ හා විවිධ ව්‍යාපාර යන් නැරඹීම යන අංශවලින් සමන්විත වේ. පුහුණු වැඩ සටහනට පහත දැක්වෙන කරුණු ඇතුළත් ය—

පොත් කර්මාන්තය
පොත් ප්‍රකාශනය පිළිබඳ ආර්ථික විද්‍යාව
පොත් නිෂ්පාදනය
අලෙවිය පිළිබඳ සැලකිය යුතු කරුණු
අලෙවිය දියුණු කිරීම හා ප්‍රචාරක දැන්වීම්,
විකුණුම් පළපුරුද්ද ඇගයීම
දීර්ග කාලීන සැලසුම්
ප්‍රකාශකයාගේ තීරණ
වෙනත් අදාළ විෂයයන්.

පාඨමාලාව අවසානයේදී උපාධියක් හෝ ඩිප්ලෝමා සහතිකයක් පිරිනමනු නොලැබේ. යථා පරිදි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු, පාඨමාලාවට සහභාගිවූ බවට සහතිකයක් නිකුත් කරනු ලැබේ.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්ෂය 1.**—රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම්

පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතුය.

**සංලක්‍ෂය 2.**—මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

2 **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය 1970. 8. 30 සිට 1970.9.26 දක්වා වන්නේ ය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ යුනෙස්කෝ බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ii) ලංකාවේ පොත් ප්‍රකාශන කළමනාකාරිත්වය පිළිබඳ වැදගත් තනතුරක ක්‍රියාකාරීව නිරතව සිටින්නන් විය යුතු වන අතර පුහුණුවෙන් පසුද එම අංශයේ උසස් තත්ත්වයක තවදුරටත් කටයුතු කිරීමට බලාපොරොත්තු විය හැකි අය විය යුතුය. (ඉහත සඳහන් 1 වැනි ඡේදයේ 3 වැනි අනුඡේදය ද බලන්න.)

(iii) ඉංග්‍රීසි පිළිබඳ උසස් ප්‍රවීනත්වයක් තිබිය යුතුයි. (පාඨමාලාව පැවැත්වෙන්නේ සම්පූර්ණයෙන්ම ඉංග්‍රීසි භාෂාවෙන් වන නිසා, අයදුම්කරුවන්ට ඉංග්‍රීසියෙන් ලිවීමට හා කථා කිරීමට මෙන්ම දේශනා තේරුම් ගැනීමට හා සාකච්ඡාවලට උද්‍යෝගිමත්ව සහභාගිවීමට පුළුවන් විය යුතුය.)

(iv) පාඨමාලාවට සහභාගිවීම සඳහා පිටත්ව යාමට පෙර, පොත් ප්‍රකාශන අංශයේ තමාගේ පෞද්ගලික ක්‍රියාකාරීත්වය හා ලංකාවේ පොත් නිෂ්පාදන ව්‍යාපාරය පිළිබඳව කෙටි වාර්තාවක් පිළියෙල කිරීමට සූදානම්ව සිටිය යුතුය. (පාඨමාලාවේ ආරම්භක කාලයේ දී මේ වාර්තාව කණ්ඩායමට ඉදිරිපත් කරනු ලැබේ.)

**සංලක්‍ෂය 1.**—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1970. 8. 30 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්‍ෂය 2 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය:—

(අ) නවදිල්ලියට යාම සහ ආපසු පැමිණීම සඳහා ගමන් පහසුකම්.

(ආ) ඉඳුම් හිටුම් හා ආහාර පාන සඳහා දෛනික දීමනාවක්.

5. මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

6. **සම්මුඛ පරීක්‍ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය කවුරු පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් ඉන්දියාවේ අධ්‍යයන පාඨමාලවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මඟින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්ව සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරගනු ලැබූ අපේක්‍ෂකයෙකු තෝරගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්‍ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍ය ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්‍ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1970. 6. 30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතුවන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුව ද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ජූනි මස 11 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

6–487—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාව

**වතු ඖෂධ සංයෝජකයන් අනුමත කිරීම සඳහා විභාගය**

වතු ඖෂධ සංයෝජකයන් ලෙස අනුමැතිය ලැබීමට කැමති අය සඳහා විභාගයක් 1970 ජූලි මස 28 වැනි දින වෛද්‍ය විද්‍යා පීඨයේදී පවත්වනු ලැබේ.

### අයදුම්පත්

2. විභාග අයදුම්පත් 1970 ජූලි මස 6 වන දින දහවල් 12 ට පෙර ලැබෙන සේ ලේඛකාධිකාරී, ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාව, කින්සි පාර, කොළඹ 8 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි.

අයදුම් පත් පහත සඳහන් අන්දමට එවිය යුතුයි :—

3. අයදුම්කරුවන් තම අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් දෑ සනාථකළ යුතුයි—

(1) පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ලාංකික පුරවැසියෙක් බව,

(2) සුදුසුකම් ලැබූ සහායක වෛද්‍ය වෘත්තිකයෙකු (ඇපෝතිකරී) නොවීන බවට, සහ

(3) පහත සඳහන් සුදුසුකම් වලින් එකක් තිබෙන බවට—

(අ) අවුරුදු දෙකකට නොඅඩු කාලයක් තුල වෛද්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ බලන සහායක වෛද්‍ය වෘත්තිකයකු ලෙස සේවයෙහි යෙදී සිටීම, හෝ

(ආ) ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාවේ ඖෂධ වේදී විභාගය සමත්ව සිටීම, සහ

(1) සුදුසුකම් ලැබූ වෛද්‍ය වෘත්තිකයෙකු යටතේ අවුරුදු 3 කට නොඅඩු කාලයක් සේවය කර තිබීම, සහ

(2) වෛද්‍ය අවශ්‍යතා ව්‍යවස්ථාවේ 176 ඡේදය යටතේ පිළිගනු ලබන වතු ආරෝග්‍ය ශාලාවක වසරක් සේවයකර තිබීම, හෝ වෛද්‍ය ව්‍යවස්ථාව යටතේ ලියා පදිංචි වෛද්‍ය වෘත්තිකයෙකු විසින් පවත්වා ගෙන යන ආරෝග්‍යශාලාවක සය මසක් සේවය කර තිබීම,

හෝ

(ඇ) ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාවේ ඖෂධවේදී විභාගය සමත් වී තිබීම, සහ

(1) අවුරුදු තුනකට නොඅඩු කාලයක් සහාය ඖෂධ සංයෝජකයෙකු ලෙස වත්තක සේවය කර තිබීම, සහ

(2) වෛද්‍ය අවශ්‍යතා ව්‍යවස්ථාවේ 176 ඡේදය යටතේ පිළිගනු ලබන වතු ආරෝග්‍ය ශාලාවක වසරක් සේවය කර තිබීම, හෝ සෞඛ්‍යසේවා දෙපාර්තමේන්තුවේ ආරෝග්‍ය ශාලාවක හෝ වෛද්‍ය ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචිවූ වෛද්‍ය වෘත්තිකයෙකු විසින් පවත්වාගෙන යන ආරෝග්‍යශාලාවක සය මසක් සේවය කර තිබීම, හෝ

(ඇ) ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාවේ ඖෂධවේදී විභාගය සමත් වී තිබීම, සහ

(1) වෛද්‍ය දෙපාර්තමේන්තුවේ හෝ යුදහමුදා වෛද්‍ය දෙපාර්තමේන්තුවේ සේවය කර තිබීම,

(2) වෛද්‍ය අවශ්‍යතා ව්‍යවස්ථාවේ 176 ඡේදය යටතේ පිළිගනු ලබන වතු ආරෝග්‍යශාලාවක වසරක් සේවය කර තිබීම, හෝ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ආරෝග්‍යශාලාවක හෝ වෛද්‍ය ව්‍යවස්ථාව යටතේ ලියා පදිංචි වූ වෛද්‍ය වෘත්තිකයෙකු විසින් පවත්වා ගෙන යන ආරෝග්‍යශාලාවක සය මසක් සේවය කර තිබීම, හෝ

(ඉ) සමූහ මලයානු රාජ්‍යයන්හි පළමුවන හෝ දෙවන ශ්‍රේණිය හෝ ආරෝග්‍යශාලා සේවකයෙකු බවට.

4. විභාග අයදුම්පත් ගාස්තුව ලෙස, ලංකාණ්ඩුවේ හිනුමට රුපියල් 45 ක් බැරකොට ඕනෑම කච්චේරියකින් ලබාගත් කුවිතාන්සියක් අයදුම් පතට ඇමිණිය යුතුයි.

5. කුමන අවස්ථාවකදී හෝ විභාග ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

### විෂයයන්

විභාගය සඳහා පහත සඳහන් අන්දමට වේ—

(1) පහත සඳහන් විෂයයන්ගෙන්, එකක් පැය 3 බැගින් ප්‍රශ්න පත්‍ර තුනකි :—

(අ) මූලික වෛද්‍ය විද්‍යාව හා ස්වස්ථතාව

(ආ) මූලික ශල්‍ය විද්‍යාව, සහ

(ඇ) ඖෂධ විද්‍යාව

(2) ඖෂධ සංයෝජනය පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකි.

(3) (අ) වෛද්‍ය විද්‍යාව, සහ
(ආ) ශල්‍ය විද්‍යාව පිළිබඳ චිකිත්සක පරීක්ෂණයකි.

(4) විෂයයන් තුනෙන් වාචික පරීක්ෂණයක්.

**නිදහස් කිරීම්**—සියලුම සුදුසුකම් ලත් ඖෂධ වේදීන් ඖෂධ විද්‍යාව පිළිබඳ පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

ඩී. ඒ. රණසිංහ,
ලේඛකාධිකාරී,
ලංකා වෛද්‍ය විද්‍යාල සභාව.

කොළඹ 8.

### අයදුම් පත්‍රය

**(මෙම අයදුම්පත පිටපත් කර පරීක්ෂාකාරීව පුරවා එවිය යුතුයි)**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ස්ථිර ලිපිනය :————.

3. (අ) ජාතිය :————.
(ආ) ඔබ ලංකා පුරවැසියෙක් ද ? :————.
(ඇ) උපන් දිනය :————.
(අංක ........... දරණ උප්පැන්න සහතිකය අමුණා ඇත).
(ඈ) අයදුම්කරු හෝ ඔහුගේ පියා ලංකාවේ ඉපදී නැත්නම්, ලංකා පුරවැසි භාවය ලැබීමේ ලියකියවිලි ඇමිණිය යුතුයි.

4. ඔබ විභාගය සඳහා සුදුසුකම් ලබා ඇත්තේ 3 න් වන රෙගුලාසියේ (අ) සිට (ඉ) දක්වා ඇති කුමන අනුඡේදය යටතේ දැයි සඳහන් කරන්න.

5. (අ) අනුඡේදය යටතේ නම් වැඩබැලීමේ සේවාකාලය සඳහන් කරන්න. එය සනාථ කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තුමාගෙන් ලබාගත් ලිපියක් ඉදිරිපත් කරන්න.

6. (ආ), (ඇ) හෝ (ඇ) අනුඡේද යටතේ නම් පහත සඳහන් දෑ සඳහන් කර එම සේවය සනාථ කිරීමේ ලියකියවිලි ඉදිරිපත් කරන්න :—

(1) ඖෂධ වේදියෙකු වශයෙන් සුසුදුකම් ලැබූ දිනය (ඖෂධ වේදියෙකු ලෙස ලැබූ ප්‍රවීනතා සහතිකය ඇමිණිය යුතුයි.)

(2) සුදුසුකම් ලත් වෛද්‍ය වෘත්තිකයෙකු යටතේ කල සේවා කාලය (එම කාලයත්, වෛද්‍ය වෘත්තිකයාගේ නමත් සඳහන් කරන්න. සාක්ෂි ඇමිණිය යුතුයි).

(3) වෛද්‍ය දෙපාර්තමේන්තුවේ හෝ වෛද්‍ය වෘත්තිකයෙකුගේ ආරෝග්‍යශාලාවක සේවාකාලය ආරෝග්‍යශාලාවේ නම, සේවා කාලය සහ වෛද්‍ය වෘත්තිකයාගේ නම සඳහන් කරන්න. සාක්ෂි ඇමිණිය යුතුයි.)

(4) වතු ආරෝග්‍යශාලාවේ නම හා එවැනි ආරෝග්‍යශාලාවක සේවාකලයක් සඳහන් කරන්න. (සාක්ෂි ඇමිණිය යුතුයි).

(5) වෛද්‍ය දෙපාර්තමේන්තුවේ හෝ යුද හමුදාවේ වෛද්‍ය දෙපාර්තමේන්තුවේ සේවය. (සාක්ෂි ඇමිණිය යුතුයි.)

7. (ඉ) අනුඡේදය යටතේ නම් ඔබ පළමුවන ශ්‍රේණියේද දෙවෙනි ශ්‍රේණියේද යන්න සඳහන් කරන්න. (සාක්ෂි සපයන්න)

8. කච්චේරියට ගෙවූ රු. 45 සඳහා කුවිතාන්සිය. (අංක........... දරණ කුවිතාන්සිය අමුණා ඇත).

9. මීට පෙර මෙම විභාගයට පෙනී සිට තිබේද ?. එසේනම් දිනය හා ප්‍රතිඵල.

ඉහත සඳහන් ප්‍රකාශයන් සත්‍ය බව ප්‍රකාශ කරමි.

————,
අත්සන.

දිනය :————.

3-461—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන අමාත්‍යාංශය—ලංකා කාර්මික විද්‍යාලය, මරදාන

### මෙම විද්‍යාලයේ වාණිජ අංශයට ශිෂ්‍යයන් බඳවා ගැනීම—අධ්‍යාපන වර්ෂය—1970/71

1970 මැයි මස 15 වැනි දින හා අංක 14,906 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළවූ පහත සඳහන් පාඨමාලාවලට ශිෂ්‍යයන් බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත් භාර ගැන්නා අවසාන දිනය 1970.6.30 දින දක්වා දීර්ඝ කර ඇති බැව් මෙයින් දන්වමි.

| පාඨමාලාව | මාධ්‍ය | කාල පරිච්ඡෙදය අවුරුදු | කාලය |
|---|---|---|---|
| (අ) ගල්බාධිකරණ වෘත්තීය පාඨමාලාව | ඉංග්‍රීසි | 4 | දිවා සහ සන්ධ්‍යා කාල |
| (ආ) පිරිවැය ගණකාධිකරණ වෘත්තීය පාඨමාලාව | ඉංග්‍රීසි | 3 | දිව සහ සන්ධ්‍යා කාල |
| (ඇ) ප්‍රවාහණය පිළිබඳ වෘත්තීය පාඨමාලාව | ඉංග්‍රීසි | 4 | සන්ධ්‍යා කාල |
| (ඈ) බැංකු ක්‍රමය පිළිබඳ වෘත්තීය පාඨමාලාව | ඉංග්‍රීසි | 3 | සන්ධ්‍යා කාල |

එස්. එල්. ද සිල්වා,
නියෝජ්‍ය අධ්‍යා. අධ්‍යක්ෂ ජනරාල් (කාර්මික අධ්‍යාපන),
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1970 ජූනි මස 8 දින,
කොළඹ 2,
අධ්‍යාපන අමාත්‍යාංශය.

6—380—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඊ. 4/69.

## ලංකා පරිපාලන සේවයේ IV වැනි පන්තියට උසස් කිරීමේ තරග විභාගය—1969

1970 අප්‍රේල් මස 3 වැනි දිනැති අංක. 14,900 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970 මාර්තු මස 23 වැනි දිනැති නිවේදනය සම්බන්ධවයි.

ඉහත සඳහන් විභාගය 1970 ජූලි මස අවසාන භාගයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන නියම දිනයන් යථාකාලයේ දී දන්වනු ලැබේ.

ඩී. ආර්. ඇල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
කොළඹ 1.
1970 ජූනි මස 9 වැනි දින.

6—447—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## මොරටුවේ-කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ තුන් අවුරුදු කාර්මිකයින්ගේ පාඨමාලව සඳහා සිසුන් ඇතුළත්කර ගැනීම

1970–71 අධ්‍යයන සැසිවාරය සඳහා කාර්මිකයින්ගේ තුන් අවුරුදු (දෙඅවුරුදු විද්‍යාලයීය හා එක් අවුරුදු කර්මාන්ත) පූර්ණ කාල දිවා පාඨමාලාව හැදෑරීම වස් ලංකා උසස් කාර්මික විද්‍යායතනයට සිසුන් ඇතුළත්කර ගැනීම පිණිස ලංකා උසස් කාර්මික විද්‍යායතනය විසින් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් බාරගනු ලැබේ.

2. සුදුසුකම් :—

(අ) වයස.—1970 ඔක්තෝබර් මස 1 දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 16 ට නොඅඩු හෝ අවුරුදු 20 ට නොවැඩි හෝ විය යුතුය.

(ආ) අධ්‍යාපන සුදුසුකම්.—අ. පො. ස. (සා. පෙ.) විභාගයේදී ශුද්ධ ගණිතය, භෞතික විද්‍යාව හා එක් භාෂාවක් ද ඇතුළුව විෂයයන් හයකින් එක්වර සාමාර්ථය ලබා තිබිය යුතු අතර යටත් පිරිසෙයින් විෂයයන් තුනකට සම්මාන සාමාර්ථය තිබිය යුතුවත් හැර යටත්පිරිසෙයින් ඉන් දෙකක් විද්‍යා විෂයයන් විය යුතුය.

3. ලංකා උසස් කාර්මික විද්‍යායතනයට ඇතුළත්වීමට ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම හැකිය.

4. මෙහි පහත 6 වැනි ඡේදයේ නියමිත දින සීමාව තුළ ඉදිරිපත් කිරීමට හැකිවනසේ පහත දක්වෙන අංක I දරණ පෝරමය පුරවා අයදුම්කරු විසින් තමා ඉගෙනගත්/දැනට ඉගෙන ගන්නා මහා විද්‍යාලයේ හෝ පෞද්ගලික ද්විතීයික පාඨශාලාවේ විදුහල්පති වෙත හැකි ඉක්මණින් යැවිය යුතුය. (මුද්‍රිත පෝරම නිකුත් කරනු නොලැබේ.)

බාහිර අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර තමා අන්තිමට ඉගෙනීම ලැබූ පාසැලේ විදුහල්පති මඟින් එවිය යුතුය.

5. පාසැල් ප්‍රධානීන් විසින් ඔවුන්ට ලැබී ඇති ඉල්ලුම් පත්‍ර මැනවින් පරීක්ෂා කර පහත දක්වෙන II අංකිත පෝරමයේ උපලේඛනයක් පිළියෙල කොට කාර්මිකයන්ගේ පාඨමාලාව හැදෑරමෙහලා අයදුම්කරුවන්ට ඇති සුදුසුකම් ගැන නිර්දේශ කළ යුතුය. මෙසේ සුදුසුකම් නිර්දේශ කිරීමේ දී අයදුම්කරුවන්ගේ අධ්‍යාපනික ක්‍රියාකාරිත්වය හා විෂය මාලාවට බාහිර වූ වැඩ කටයුතු සැළකිල්ලට ගත යුතුය. (මුද්‍රිත පෝරම නිකුත් කරනු නො ලැබේ.)

6. පාසැල් ප්‍රධානයන් විසින් ඉල්ලුම් පත්‍ර හා ඔවුන්ගේ නිර්දේශ ඇතුළත් උපලේඛන ද 1970 ජූලි මස 9 වැනි දින නොඉක්මවා ලැබෙන සේ මොරටුවේ කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ලේඛනාධිකාරි වෙත එවිය යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

7. ඇතුළත් කර ගැනීම සඳහා ශිෂ්‍යයන් තෝරාගනු ලබන්නේ ලිඛිත විභාගයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

8. අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය නොමැතිව, කාර්මිකයින්ගේ පාඨමාලාව අවුරුදු දෙකක් හැදෑරීමෙන් පසුව, කාර්මිකයින්ගේ අවසාන විභාගයේදී නියමිත තත්ත්වයක් ලබාගන්නා මෙම විද්‍යාලයේ හා අම්පාරෙ හාඩි ජෝසෆ් කාර්මික විද්‍යායතනයේ හොඳම ශිෂ්‍යයන් 50 දෙනාට (ඉංජිනේරු උපාධි පාඨමාලාවකට සමාන) පස් අවුරුදු කාර්මික විද්‍යා පාඨමාලාවේ ඩිප්ලෝමා සඳහා ස්ථාන 50 ලැබෙනු ඇත. (ලබා ගතයුතු තත්ත්වය පසුව නියම කරනු ලැබේ).

ඇල්. එච්. සුමනදාස,
අධ්‍යක්ෂ.

ලංකා උසස් කාර්මික විද්‍යායතනය,
කටුබැද්ද-මොරටුව.
1970 ජූනි මස 10 වැනි දින.

### පෝරමය I

### මොරටුවේ-කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් පත්‍රය

සැළකිය යුතුයි.—ඉහත දක්වෙන දන්වීමේ ප්‍රකාර අධ්‍යාපන සුදුසුකම් ඇති හා නියමිත වයස් සීමාව තුළ සිටින අය පමණක් ඉල්ලුම් කළ යුතුයි.

1. සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. උපන් දිනය :————.

(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)

4. 1970.10.1 දිනට වයස අවුරුදු :———— මාස :———— දින :————

5. ජාතිය :————.

6. ස්ත්‍රී පුරුෂ භාවය :————.

7. පියාගේ/මවගේ හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.

8. ඉගෙනගත් මහා විද්‍යාලයේ හෝ පෞද්ගලික ද්විතීයික පාඨශාලාවේ නම හා ලිපිනය :————.

9. (අ) ඉහත දැක්වෙන දැන්වීමේ 2(ආ) ඡේදයේ සඳහන් අධ්‍යයන සුදුසුකම් ලබාගත් අ. පො. ස. (සා. පෙ.) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ආ) සමත් වූ විෂයයන් හා ලබාගත් තත්ත්වය (සාමාන්‍ය සාමාර්ථය, සම්මාන සාමාර්ථය, විශිෂ්ට සාමාර්ථය ආදි වශයෙන්) :—

| | විෂයයන් | ලබාගත් තත්ත්වය |
|---|---|---|
| 1. | ශුද්ධ ගණිතය | ...................... |
| 2. | භෞතික විද්‍යාව | ...................... |
| 3. | භාෂාව | ...................... |
| 4. | .............. | ...................... |
| 5. | .............. | ...................... |
| 6. | .............. | ...................... |

10. විෂය මාලාවෙන් බාහිර ක්‍රියාකාරිත්වයන් :————.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**ෆෝර්මය II**

ඉල්ලුම්පත්‍ර උපලේඛනය ;— පාඨශාලාවේ නම:—

| අංකය | අයදුම්කරුගේ නම හා ලිපිනය | උපන් දිනය | සමත්විෂයයන් ශ්‍රේණි සහිතව | | | අ.පො.ස. (සා.පෙ.) සමත් වර්ෂය | අධ්‍යාපන ප්‍රගතිය | පාඨශාලා ප්‍රධානියාගේ නිර්දේශය හා වෙනත් කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | භාෂා | විද්‍යා | වෙනත් | | | |
| | | | | | | | | |

විද්‍යාලයාධිපතිගේ අත්සන :————.
දිනය :————.

6-462—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2.) 1970.10.1 සිට 1971.9.30 තෙක්, මෙරට සෑදූ සබන් සැපයීම සඳහා 1970 ජූලි මස 21 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, අංක 363, දරණ "විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන්" තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවා ගෙන ඒ සඳහා ලැබෙන සහතික පත් ස්වකීය ටෙන්ඩර් පත්‍ර සමග අමුනා ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ්‍ය තැනගෙන් ෆෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 ජූලි මස 20 වැනි සඳුදා දහවල් 12 වනතෙක් ටෙන්ඩර් ෆෝරම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970 ජූනි මස 18 වැනි දින,
කොළඹදීය.

6-463—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

### 1970/71 දී අම්ලකර ආදිය සැපයීම

1970.5.22 දින අංක 14,907 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවූ නිවේදනය හා සම්බන්ධවයි.

ඉහත සඳහන් සැපයීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1970.7.7 තෙක් කල් දමා තිබෙන බව ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තුවන ටෙන්ඩර්කරුවන් කරුණාවෙන් සලකත්වා.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970 ජූනි මස 18 දින,
කොළඹ දී ය.

6–464/1—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## චීනවට්ටි ගිනිදඬු සැපයීම සඳහා ටැන්ඩර

චීනවට්ටි ගිනිදඬු 700 ක් තනා සැපයීම සඳහා, කොළඹ 7, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු පාරේ නො. 42 දරණ ස්ථානයේ පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජූලි මස 15 වැනි බුද දින අ. භා. 2.30 දක්වා දේශීය නිෂ්පාදකයන්ගෙන් ටැන්ඩර් භාරගනු ලැබේ. රු. 50 ක මුදලක් වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක්, කොළඹ 7, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු පාරේ නො. 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස් වෙත ඉදිරිපත් කර ලබගත්තාවූ ආකෘති පත්වල දෙපිටපතකින් ටෙන්ඩර් සකස් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ නො. 60 දරණ ස්ථානයේ පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක් වෙත මෙම මුදල තැන්පත් කළ හැක.

1970.7.13 වැනි දින දවල් 2.30 දක්වා ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර ඇවැසි නම්, කොළඹ 7, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු පාරේ, නො. 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්ගෙන් ලබාගත හැක.

ඩී. ඊ. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 7, 1970 ජූනි 18.

6–493—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඇල් ඩබ්ලිව්/2/26.

## පුත්තලම කච්චේරිය

රුපියල් 15,000 ට හෝ ඊට වඩා කොන්ත්‍රාත් සඳහා රජයේ ලියාපදිංචි වී සිටින පුද්ගලික කොන්ත්‍රාත්කරුවන්ගෙන්, විවිධ සේවා සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති ආදී සමිතිවලින් මෙහි සඳහන් තැනිම්වලින් එකකට හෝ වැඩි ගණනක් සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් 1970 ජූලි මස 5 වැනි දින සවස 2.30 දක්වා පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාර ගනු ලැබේ :—

(1) නාත්තන්ඩිය, තබ්බෝව අක්කර 80 ග. පු. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(2) නාගහකඩුව ග. පු. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(3) පාළුවත්ත ග. පු. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(4) මට්ටකොඩුවැල්ල ධීවර ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(5) තල්විල ධීවර ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(6) පහල කටුනේරිය ධීවර ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(7) තොඩුවාව ධීවර ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(8) නැබොඩගහයාය ග. පු. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(9) නිකවැරටිය මැ. කො. පොත්තුකුලම-කළුකැලේ පොදු ළිඳක්.
(10) සේරුකැලේ-මුදලක්කුලියේ පොදු ළිඳක්.
(11) වෙන්දකඩුව-පල්ලම ග. පු. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(12) ගල්කුලිය ම. ප. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(13) හලාවත මැ. කො., අඹකැලේ ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(14) අත්තනගනේ ග. පු. ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(15) පුත්තලම මැ. කො. වෙට්ටාලෙයි ව්‍යාපාරයේ පොදු ළිඳක්.
(16) පුත්තලම කච්චේරි භූමියේ ලොරි ගරාජයක්.

2. ඉහත සඳහන් වැඩ සම්බන්ධයෙන් අවශ්‍ය විස්තර දැන ගත හැකි පුත්තලම කච්චේරියේ ඉඩම් අංශයෙන් ලබා ගත හැකි ආකෘති පත් මගින් එකී එක් එක් වැඩය සඳහා වෙන වෙනම පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. එකී එක් එක් වැඩය සඳහා රු. 25 බැගින් පුත්තලම කච්චේරියේ තැන්පත් කර ලබා ගත් කච්චේරි කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පත් ලබාගත හැකිය. එම ටෙන්ඩර් ආකෘති පත් 1970 ජූලි මස 4 වැනි දින දවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පත්, පුත්තලම කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ පුත්තලම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීම හෝ කළ හැකිය.

ඇම්. ඩබ්ලිව්. ඇස්. ගුණරත්න,
පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජූනි මස 9 දින,
පුත්තලම කච්චේරියේ දී ය.

6–494—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### නිකවැරටිය උප කොට්ඨාශය

නිකවැරටිය උප කොටසට අයත් පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත් 1970 ජූලි මස 7 වැනි අඟහරුවාදා පෙ.ව. 10. දක්වා කුරුණෑගල වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

| වැඩ විස්තරය | ටෙන්ඩර්කරුගේ ලියාපදිංචි මුදල | ටෙන්ඩර් තැන්පත් මුදල |
|---|---|---|
| | රු. | රු. |
| (1) අඹකොලවැව ද්වීත්ව කම්කරු නිවාශයක් ඉදි කිරීම ... ... | 25,000 ... | 25 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දක්වෙන ප්‍රමාණයට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1970 ජූලි මස 4 වැනි සෙනසුරාද (එදින ඇතුළුව) කාර්යාල වේලාව තුලදී කුරුණෑගල/නිකවැරටිය/පුහුණු කිරීමේ මධ්‍යස්ථානය ගල්ගමුව යන වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘතිපත් වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට ප්‍රථම ඉහත දක්වෙන පිළිවෙලට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන සියළුම විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැළසුම, විශේෂ විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුලදී නිකවැරටිය උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

කේ. එස්. සිතම්පරපිල්ලෙයි.
වාරිමාර්ග ඉංජිනේරු,
නිකවැරටිය උප කොට්ඨාශය,

1970 ජූනි මස 3 වැනි දින,
නිකවැරටිය වාරිමාර්ග කාර්යාලයේ දී ය.

6–370—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—පොලොන්නරුව උප කොට්ඨාසය

උතුරු මැද පළාතේ පොලොන්නරුව උප කොට්ඨාශයේ කණිෂ්ඨ නිලධාරි නිවාසයක් ඉදිකිරීම සඳහා පොලොන්නරුව ඊශාන කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 ජූලි මස 5 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් අයදුම්පත් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලෙහිම සිදු කෙරේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 25,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට සමුපකාර සමිතිවලට සහ ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

1970 ජූලි මස 2 දින පස්වරු 4.30 දක්වා කාර්යාලීය වේලාවන් තුළදී කවුඩුල්ල/මින්නේරිය/පොලොන්නරුව යන වාරිමාර්ග කාර්යාලවලින් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝරම්වල පමණක් ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් ෆෝරම සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ ඔවුන් දැනට කරන වැඩ සහ ඒවායේ වටිනාකම් දැක්වෙන ප්‍රකාශකයක් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද, නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත්කිරීමට පෙර මෙම වැඩය සඳහා රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග කාර්යාලවල හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

මෙම වැඩ සඳහා සියළු විස්තර සැලැස්ම ආදිය කාර්යාලීය වේලාවන් තුළදී පොලොන්නරුව වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

එම්. යෝගාරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු, පොලොන්නරුව උප කොට්ඨාසය.

වාරිමාර්ග කාර්යාලය,
පොලොන්නරුව,
1970.6.8

6–467—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### රාත්තල් 750 ක් බර වැඩුණු එළදෙනක් විකිණීම

කොළඹ, ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් කුරුවිට කරපිංච ගොවිපලේ සිටින රාත්තල් 750 ක් පමණ බර ඇති ගැබ් නොගත් නා මිශ්‍ර සින්ධි වර්ගයේ එළ දෙනක් විකිණීම සඳහා 1970 ජූලි මස 2 දින දහවල් 12 දක්වා සීල් තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කොළඹ 2, වොක්ෂෝල් වීදියේ අංක 315 දරණ ස්ථානයේ, ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලයෙන් මේ සඳහා නියමිත ෆෝරම ලබාගෙන ඒ මගින් ටෙන්ඩර් දෙපිටපතකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් නිසි ලෙස සකස්කර කවරයක බහා සීල් තබා කවරයේ ඉහළ වම් කෙළවර "කරපිංච ගොවිපලේ එළදෙන සඳහා ටෙන්ඩරය" යන්න පැහැදිලිව සඳහන්කර "ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය, තැ. පෙ. 622, අංක 315, වොක්ෂෝල් වීදිය, කොළඹ 2" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ටෙන්ඩර්කරුවන් කැමතිනම් නිසි ලෙස සකස්කළ ටෙන්ඩර් එම ස්ථානයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීම හෝ කළ යුතුය.

3. ටෙන්ඩර් ෆෝරම නිකුත් කරනු ලබන්නේ ටෙන්ඩර් ෆෝරමයක් වෙනුවෙන් රුපියල් දහයක් (රු. 10) තැන්පත් කළ බවට මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණි. මුදල් තැන්පත් කිරීම දිවයිනේ ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී කළ හැකියි.

4. ටෙන්ඩර් ෆෝරම 1970 ජූලි මස 2 දින පෙරවරු 10 දක්වා නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ දී ඉල්ලුම්කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

5. නියම කරන දිනකට පෙරාතුව, තෝරාගත් ටෙන්ඩර්කරු විසින් එළදෙනගේ සම්පූර්ණ වටිනාකම, කරපිංච ගොවිපලේ කළමණාකරු වෙත එකවර මුදලින් ගෙවා රිසිට්පතක් ලබාගෙන එළදෙන ගොවිපලෙන් බැහැරට ගෙනයා යුතුය.

6. ටෙන්ඩර් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ සම්පූර්ණ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුය.

7. මේ පිළිබඳව වැඩිමනත් විස්තර කුරුවිට, කරපිංච ගොවිපලේ කළමණාකරුගෙන් ලබාගත හැකිය. එළදෙන පරීක්ෂා කිරීමට අවශ්‍ය නම්, කාර්යාල වේලාවන් තුළ දී කරපිංච ගොවිපලේ කළමණාකාර මහතාගේ අවසරය ඇතිව එසේ කිරීමට හැකිවේ.

ඒ. ඩබ්. පෙරේරා,
පරිපාලන නිලධාරි (ගොවිපල් පාලන හා නිෂ්පාදන),
කොළඹ.

1970 මැයි මස 30 දින,
කොළඹ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී.

6–364—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

පහත සඳහන් හාල් මෝල්වලට රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජූලි 15 වෙනි බදාදා සවස 2.30 දක්වා භාරගනු ලැබේ.

1. (අ) පිරිසිදු එමරි කුඩු අංක 20 ... ටොන් 1 යි.
(ආ) පිරිසිදු එමරි කුඩු අංක 18 ... ටොන් 1 යි.
(ඇ) පිරිසිදු එමරි කුඩු අංක 16 ... ටොන් 1 යි.
(ඈ) මැග්නීසියම් ක්ලෝරයිඩ් ... ටොන් 1 යි.
(ඉ) මැග්නීසියම් සිලිකේට් (කිංස් සිමෙන්ට්) ... ටොන් 1 යි.

එමරි කුඩු හොණ්ඩර එකේ මලුවල අසුරා තිබිය යුතුයි. මැග්නීසියම් සිලිකේට් හා මැග්නීසියම් ක්ලෝරයිඩ් හොණ්ඩර එකේ පීප්පවල තිබිය යුතුය.

මේ සඳහා අවශ්‍ය ආනයන බද්ද දෙපාර්තමේන්තුව මගින් ගෙවනු ලැබේ. මෙම ද්‍රව්‍ය විවෘත සාමාන්‍ය බලපත්‍රයක් යටතේ ආනයනය කළ හැකිවේ.

2. ඉහත සඳහන් රසායනික ද්‍රව්‍ය මරදානේ පිදුනීෂියා ගුදම්වල තිබෙන මෙම දෙපාර්තමේන්තුවේ ගබඩාවට ගෙනවිත් භාරදිය යුතුය. මෙම ද්‍රව්‍ය ගෙනවිත් භාරදිය හැකි ඉතාමත් කිට්ටුම දිනය ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කළයුතු අතර, ඉක්මණින් සැපයිය හැකි ටෙන්ඩර් කරුවන් ගැන විශේෂයෙන් සලකා බලනු ලැබේ. රාත්තලක පමණ ප්‍රමාණයේ වූ රසායනික ද්‍රව්‍ය ටෙන්ඩර් පත්‍රය සමඟ ඉදිරිපත් කළයුතුය.

3. රු. 50 ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ බව කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්වරයාගෙන් ලබා ගතහැකි ආකෘති පත්‍රවල මෙම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරි වෙත හෝ කොළඹින් පිටදී ඕනෑම කච්චේරියක මෙම මුදල තැන්පත් කළහැකිය. 1970 ජූලි 13 වන සඳුදා 2.30 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. මේ සම්බන්ධයෙන් තවත් යම් තොරතුරක් අවශ්‍ය වුවහොත් කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස්වරයාගෙන් ලබාගනු මැනවි.

ඩී. බී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970 ජූනි 5 වන දින,
කොළඹ 7,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
අංක 42 හි, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

6–491—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### මහඉළුප්පල්ලම පාසැල් ගොවිපලට වතුර පොම්ප සහිත වතුර මැෂිමක් ලබාගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම

මහඉළුප්පල්ලම පාසැල් ගොවිපලට වතුර පොම්පයක් සහිත වතුර මැෂිමක් ලබාගැනීම සඳහා ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970 ජූලි මස 6 වැනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

වතුර පොම්පය හා වතුර මැෂිම පිළිබඳ විස්තරය පහත දක්වේ.

ඩ්‍රෝබාර් එකක් සහිත රබර් රෝද දෙකක් හෝ හතරක් වූ ට්‍රොලියක් මත සවිකරන ලද්දාවූද, ඩීසල් තෙලින් ක්‍රියාකරන පිස්ටන් තුනක් හෝ හතරක් සහිත අශ්වබල 30—40 දක්වා වූ ශක්ති ප්‍රමාණයෙන් යුක්ත වූද, යන්ත්‍රයකට කෙලින්ම ඒකාබද්ධ කරන ලද්දාවූ හා එම යන්ත්‍රයෙන් ක්‍රියා කරවිය හැකි අඟල් හයක විෂ්කම්භය සහිත ඇතුල් කිරීමේ හා පිට කිරීමේ විවරයක් සහිත අඩි 25ක් උඩට උරා ගැනීමේ ශක්තිය ඇත්තා වූද, අඩි 60—80 දක්වා උසට බෙදාහැරීමේ ශක්තිය ඇත්තාවූද, විනාඩියකට වතුර ගැලුම් 400—600 දක්වා ප්‍රමාණයක් පිට කළ හැකි ස්වඋරාගැනීමේ ශක්තියෙන් වූ වතුර පොම්පයක් සහිත යන්ත්‍රයක් විය යුතුයි. වතුර මැෂිමේ ඇතුල් කිරීමේ හා පිට කිරීමේ විවර වලට කෑලි දෙකකින් යුක්තවූ අඟල් හයක විෂ්කම්භය ඇති අඩි 60ක් දිග උරාගැනීමේ රබර් බටයක් ද, කෑලි දෙකකින් යුක්ත වූ අඟල් හයක විෂ්කම්භය ඇති අඩි 60 ක් දිග පිටකිරීමේ රබර් බටයක්ද අවශ්‍ය නැමි සමග සවිකර තිබිය යුතුය.

මෙම යන්ත්‍රය සමග ඊට අදාල වූ අවි ආයුධ කට්ටලයක් ද උපදෙස් හා අමතර කොටස් විස්තර දැක්වෙන පොත් කට්ටලයක් ද සැපයිය යුතු අතර, මෙම යන්ත්‍රය මහඉළුප්පල්ලම පාසැල් ගොවිපලට ගෙනවිත් ක්‍රියාකරන අයුරු පෙන්වා දී භාරදිය යුතුයි.

**2.** අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරී තැනගෙන් ආකෘති පත්‍ර ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුය. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක බහා මුද්‍රා තබා අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතු අතර, ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ " මහඉළුප්පල්ලම පාසැල් ගොවිපලට වතුර මැෂිමක් සැපයීම " යන්න සඳහන් කළ යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර අනු පිටපතකින් යුක්ත විය යුතු අතර, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් ඒවා අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරිට අතින්ම භාරදිය යුතුයි.

4. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කළ දිනයේම ඒ ඒ ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනහොත් ඔහු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. 1970.7.5 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ, ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට රුපියල් විසිපහක (රු. 25) මුදලක් තැන්පත් කර ඇති බවට කුවිතාන්සියක් අනුරාධපුර නව නගරයේ ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරිට ඉදිරිපත් කළ පසුවය. මෙම තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පේරාදෙණියේ ප්‍රධාන කාර්යාලයේ හෝ කළ හැකිය. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් නියම කරනු ලබන කාලයක් තුළදී මෙම වතුර පොම්පය ගොවිපලට සැපයිය යුතුය. එසේ නොහැකි වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රජසන්තක වනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවටද ඇතුළත් වීමට ඉඩ ඇත.

6. පිළි නොගන්නා ලද ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් නිදහස් කිරීමට අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදක කාර්යාලයේ පරිපාලන නිලධාරි තැන කටයුතු කරනවා ඇත.

7. නියමිත ආකෘති පත්‍රයේ ලියා නැති, නැතහොත් එකී නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් වශයෙන් සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන් වල ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන තැබිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරණු ලබන මිළ ගණන් යටත් පිරිසෙයින් සති පහකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

9. ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයේ ලියා තිබිය යුතුය.

10. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම්, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත ඉහත කී දින, එකී වේලාවේදී අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබාගනු ලැබේ.

12. ටෙන්ඩර්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට යැව්වොත් හෝ ඔහුගේ අතටම භාරදුන්නා ලෙස සලකනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වන කෙනෙකුගේ නම සමග ඇතුළත් වූ හෝ ටෙන්ඩර් මණ්ඩලයට සැහේ යයි පෙනී යන විට ටෙන්ඩර් මණ්ඩලය විසින් එකඟ නොවන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු හෝ දෙවර්ගයේම " ලාංකික " කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරටත් එසේ බඳවා ගනු ලබන්නේ වැඩ කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

15. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා කිසියම් විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද " ලාංකික " නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

16. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

17. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා " ලාංකික " යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කරන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වේ.

18. මෙම කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් ඉදිරියට ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසි වලට අනුකූලවූද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

19. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් සහ සම්බන්ධ ඔහුගේ පොතපත, චැක්රෝල්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

20. 1934 අංක 19 දරන කම්කරු වන්දි ආඥාපනත (117 පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුය.

21. මේ පිළිබඳ වැඩි විස්තර ඒ ගොවිපල කළමනාකරුගෙන් විමසන්න.

ඇම්. ඇල්. සී. ඉලංගකෝන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂිකර්ම ගොවිපල්).

1970 ජූනි මස 6 දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
කෘෂිකර්ම ගොවිපල් කාර්යාලයේදී ය.

6–369—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## වී තැම්බීමේ ටැංකි රත් කිරීම සඳහා දහයියා ලිප් (ගිනිපෙහෙණි) 28 ක් තනා සැපයීම සඳහා ටෙන්ඩර්

වී තැම්බීමේ ටැංකි රත් කිරීම සඳහා සඳහා දහයියා ලිප් (ගිනි පෙහෙණි) 28 ක් තනා සැපයීම සඳහා, කොළඹ 7, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු පාරේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජූලි මස 15 වැනි දින (බදාදා) පස්වරු 2.30 දක්වා දේශීය නිෂ්පාදක යින්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ. රු. 50 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කොට කොළඹ 7, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු පාරේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොම සාරිස්වරයාගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කල යුතුයි. මෙම මුදල, කොළඹ 7 හෝර්ටන් පෙදෙසේ අංක 60 දරන ස්ථානයේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කල හැකිය. 1970.7.13 වැනි දින දවල් 2.30 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

මේ පිළිබඳව තවදුරටත් අවශ්‍ය වියහැකි තොරතුරු, කොළඹ 7, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු පාරේ අංක 42 දරණ ස්ථානයේ ගොවිජන සේවා කොමසාරිස් වරයාගෙන් ලබාගත හැකිය.

වී. පී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970.6.18 වැනි දින,
ගොවිජන සේවා දෙපාතීමේන්තුව,
42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු පාර,
කොළඹ 7.

6–490—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## යාපනය දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති මහා ලේකම් කායශීලය යාපනය විසින් 70.7.23 දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් බාරගනු ලැබේ

### වැඩයේ ස්වභාවය

(1) යාපනය දිස්ත්‍රික්කයේ කරාච්චි ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ වෙලි කන්ඩල් ගමෙහි පිහිටා ඇති ඇතුල් පාරට බොරළු දැමීම (අතිරේක වැඩ)

(2) යාපනය දිස්ත්‍රික්කයේ කරාච්චි ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ වන්නේරිකුලම් ගොවිජනපද ව්‍යාපාරයට යන ඇතුල් පාර අළුත් වැඩියා කිරීම.

(3) යාපනය දිස්ත්‍රික්කයේ වැලිකාමම් උතුරු කොට්ඨාශයේ වසන්තපුරම් ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරයට යන ඇතුල් පාර සෑදීම.

2. වැඩය ඉදිරියේ සඳහන් කර ඇති දක්වා වූ හෝ ඉන් ඉහල වැඩ සඳහා රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී සිටින්නන්ට, කම්කරු සමිතිවලට, විවිධ සේවා සමුපකාර සමිතිවලට හෝ ග්‍රාම සංවර්ධන සමිතිවලට යාපනය කච්චේරියේ ඉඩම් ශාඛාවේදී 70.7.16 දින පස්වරු 3 දක්වා ටෙන්ඩර් ආකෘති නිකුත් කෙරෙනු ඇත. කොන්ත්‍රාත්තුව බලාපොරොත්තු වන අය තමන් එසේ ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි යාපනය දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් වෙනුවෙන් රු 25 ක තැන්පත් මුදලක් ගෙවූ බවට වූ කුවිතාන්සියක් ඉදිරිපත් කොට යාපනය දිසාපතිගෙන් ලබාගත හැකි ආකෘතිවල දෙපිටපතකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල මේ දැන්වීම පළ කරනු ලැබීමෙන් පසු තැන්පත් කළ යුතු අතර, එම තැන්පතුවට සාක්ෂි වශයෙන් ලබා ගන්නා ලද කුවිතාන්සිය ටෙන්ඩරයට ඇමිණිය යුතුය. අනුමත සමිති ටෙන්ඩර් තැන්පතුවෙනුත් ඇප තැන්පතුවෙනුත් නිදහස් ය. එසේ වුවද ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ ඉහත සඳහන් ලියාපදිංචි ඉදිරිපත් කළ විට පමණි.

4. ටෙන්ඩර්පත් යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩරය අනාවරණය කරන කවරය මුද්‍රා තැබිය යුතු අතර එහි වම් පස උඩ කෙළවරේ වැඩයේ නම සඳහන් කළ යුතුය. ටෙන්ඩරය ලියාපදිංචි තැපැලෙන් නොඑවනු ලැබේ නම් එය යාපනය මහා ලේකම් කාර්යාලයේ කාර්යාල සහකාරගේ කාමරයේ තබාගෙන ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව පැමිණ තැන්පත් කළ හැකිය.

5. I වැනි ඡේදයේ දැක්වෙන වේලාවට පසු ලැබෙන ටෙන්ඩර් බාර ගනු නොලැබේ.

6. ටෙන්ඩර් බාරගැනීම අවශ්‍යවූ විට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන් පැමිණ සිටිය යුතුය.

7. ටෙන්ඩරය බාර ගන්නා ලද බව ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබ දින 10 ක් ඇතුළත යම් කෙනෙකු ගිවිසුමට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළොත් හෝ අත්සන් කිරීමට අසමත් වුවහොත් එසේ නැතහොත් අනුමත කරන ලද ඇප මුදල බැඳීමට අසමත් වුවහොත් ටෙන්ඩර් තැන්පතුව රාජසන්තක කරනු ලබේ.

8. පිළිගනු ලැබූ කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවීමේදී සේවයට ගත යුත්තේ පුහුණු හා නුපුහුණු ලාංකික කම්කරුවන් පමණක් වන අතර, හැකි තාක් දුරට එම කම්කරුවන් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම බඳවා ගත යුතුය.

9. පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුට ගිවිසුමක් අත්සන් කිරීමටත්, ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියේට 5 ක් ඇප වශයෙන් යාපනය දිසාපති වෙත තැන්පත් කිරීමටත් එම ගිවිසුම අත්සන් කරනු ලැබී මෙන් මාස තුන (3) ක් ඇතුළත වැඩ අවසන් කර බාර දිමටත් නියම වනු ඇත.

10. වැඩ පිළිබඳ වෙනත් අවශ්‍ය විස්තර ඇතොත් යාපනය දිසාපති ගෙන් ලබා ගත හැකිය.

11. පැහැර හැරි කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවේ නම් සඳහන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් බාරගනු නොලැබේ.

12. ප්‍රශ්නයෙන් තොරව, කිසියම් ටෙන්ඩරයක් හෝ සියලු ටෙන්ඩර හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ බාර ගැනීමේ අයිතිය දිසාපති තබා ගනී.

13 ටෙන්ඩර් කරුවන් තමන් ඉදිරිපත් කරන ගණන්, ටෙන්ඩර් විවෘත කරනු ලබන දිනයේ සිට මාසයක් විවෘතව තැබිය යුතුය.

කේ. පොන්නම්බලම්,
යාපනය දිසාපති වෙනුවට.

1970 ජූනි මස 10 දින,
යාපනයේ මහා ලේකම් කාර්යාලයේ,
ඉඩම් කාර්යාලයේදීය.

6–493—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රී ජිනරත්න පාරේ අංක 48 දරණ භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් සර්කෝන් දිග ටොන් 100 ක් මිළයට ගැනීම සඳහා මිළ ගණන් 1970 අගෝස්තු මස 18 වැනි දින පස්වරු 2 දක්වා භාර ගනු ලැබේ.

රු. 25 ක මුදලක් තැන්පත් කළ බව්ට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල මාගීයෙන් අනුපිටපත් ඇතිව මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය. 1970 අගෝස්තු 17 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

මිළ ගණන් ඉදිරිපත් කිරීමේ කොන්දේසි, වගී වීග්‍රහය, ඇසිරීමේ සහ භාරදීමේ ක්‍රම ආදිය පිළිබඳ සම්පූර්ණ විස්තර භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂගෙන් ලබාගත හැක.

එල්. ජේ. ඩී. ප්‍රනාන්දු,
භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ.

භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව,
කොළඹ 2,
1970.6.1.

6–363—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### සේවයට නුසුදුසු මෝටර් වාහන හයක් විකිණීම

මරදානේ තැපැල් සහ විදුලි සංදේශ ගබඩා භූමියෙහි ඇති විදුලි සංදේශ ප්‍රවාහන අංශයට අයත් සේවයට නුසුදුසු මෝටර් වාහන හයක් (6) විකිණීම සඳහා කොළඹ 1, තැපැල් හා විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ පස්වන මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයේ ගැනුම්පත් මණ්ඩල සභාපති විසින් 1970 ජූලි මස 9 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, පස්වන මහලේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබා ගත් ෆෝර්ම වලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීමට ද, අවශ්‍ය විස්තර දැන ගැනීමට ද පුළුවන. මරදානේ තැපැල් සහ විදුලි සංදේශ ගබඩාවේ ප්‍රවාහන නිලධාරි තැන හමුවී වාහන පරීක්ෂා කර බැලීමට පිළිවෙළ යොදාගත හැකිය.

3. තැපැල් කාර්යාලයක හෝ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක්, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1970 ජූලි මස 5 වෙනි දින දවල් 12 වන තෙක් බලාපොරොත්තු ටෙන්ඩර් කරුවනට ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබාගත හැකිය.

වී. අලගරත්නම්,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
ලෝටස් පාර, කොළඹ.

6–496—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## විභාග දෙපාර්තමේන්තුව

### පාවිච්චි කරන ලද තැපැල් මුද්දර විකිණීම

ශත 5 සිට ශත 60 දක්වා නාමික වටිනාකම ඇති පාවිච්චි කරන ලද තැපැල් හා ආදායම් මුද්දර විශාල ප්‍රමාණයක් විකිණීම සඳහා කොළඹ 2, මැලේ වීදියේ, විභාග දෙපාර්තමේන්තුවේ තිබේ. මෙම මුද්දර මිලදී ගැනීමට කැමති අයට මෙම කායඹාලයේ දී 1970 ජූනි මස 18 වැනි දින සිට 1970 ජූලි මස 4 වැනි දින දක්වා සාමාන්‍ය කායඹාල වේලාව තුළදී ඒවා පරීක්ෂාකර බැලීමට පුළුවන.

2. මෙම මුද්දර මිලදී ගැනීම සඳහා මිල ගණන් සඳහන් කරන ලද ඉල්ලුම් පත් සීල් තබා රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතු අතර ඒවා බහා එවන කවරයේ වම් මුදුන් කෙළවරේ "එස්.ඕ.යූ.එස්." යන්න සඳහන් කොට 1970 ජූලි මස 5 වැනි දින පස්වරු 2.30 ට පෙර ලැබෙන සේ එවිය යුතුයි.

3. 1970 ජූලි මස 5 වැනි දින පස්වරු 3 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී මෙම කායඹාලයට පැමිණිය හැකිය.

4. පිළිගත් ටෙන්ඩරය එවන අය එය පිළිගැනීමේ දින සිට දින 3ක් ඇතුළත දී මුදල් ගෙවා මුද්දර තොගය ගෙන යා යුතුය.

කේ. ඩී. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්.

1970 ජූනි මස 8 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේදී ය.

6–390—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### පිං භාජන සෑදීම සඳහා පිත් තහඩු සැපයීම

අංක 14,907 හා 1970.5.22 දින දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය මගින්, ඉහත සඳහන් සැපයීම සඳහා කැඳවනු ලැබූ ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය 1970 ජූලි 6 වෙනි සඳුදින තෙක් කල් දමා ඇති බව ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් කරුණාවෙන් සලකත්වා.

කේ. බී. දිසානායක,
අලෙවි සංවර්ධන කොමසාරිස්.

1970 ජූනි මස 9 දින,
කොළඹ.

6–430—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

1970 ජූලි මස 10 වැනිදා පෙ. ව. 10 දක්වා මෙහි පහත දැක්වෙන වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ගොඩනැගිල්ලේ අතිරේක ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

(අ) මීගමුව තැපැල් කාර්යාලයේ හා මීගමුව තැපැල් ස්ථානාධිපති නිල නිවාසයේ ද පරිපාලන නිලධාරි නිල නිවාසයේ ද ඇති බාල්දි වැසිකිළි අටක් ජල මුද්‍රිත ක්‍රමයට හැරවීම.

2. රු. 10,000 කට හෝ එයට වැඩියෙන් ගණනකට ලියාපදිංචි වූ රජයේ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මෙම වැඩ සඳහා ඉල්ලුම් කළ හැකිය.

3. මෙම වැඩ වෙනුවෙන් ඕනෑම තැපැල් කාර්යාලයක රු. 25 ක මුදලක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් කොළඹ (බටහිර-උතුර) ප්‍රාදේශීය තැපැල් අධිකාරී වෙත ඉදිරිපත් කිරීමෙන් පසු, ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ 1970 ජූනි මස 15 වැනි දින සිට 1970 ජූලි මස 5 වැනිදා ප. ව. 4.30 දක්වා පමණි.

4. ටෙන්ඩර පත්‍ර සම්පූර්ණ කර අනුපිටපතක් ද සහිතව ලේඛනගත තැපැලෙන් සභාපති, අතිරේක ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය, කොළඹ 1 යන ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර් බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම "මීගමුව තැපැල් කාර්යාලයේ බාල්දි වැසිකිළි ජල මුද්‍රිත කිරීම" යනුවෙන් පැහැදිලිව ලියා තිබිය යුතුය.

5. ටෙන්ඩර්කරු විසින් එවන ලද ටෙන්ඩර් පත්‍රයේ කරනු ලැබූ මැකීම්, කපාහැරීම් හෝ පසුව වෙනස් කිරීම් ඇදී සෑම ස්ථානයකම ඔහුගේ කෙටි අත්සන් තැබිය යුතුය

6. අවශ්‍ය වැඩ විස්තර හා වෙනත් විස්තර, කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ, ප්‍රාදේශීය තැපැල් අධිකාරී (බටහිර-උතුර) කාර්යාලයෙන් ලබාගත හැක.

වර්නන් එම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂක.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1.

6–452—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පීඑස්සී 1/8/70

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### හයිඩ්‍රොක්ලොරොතයසයිඩ් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් හයිඩ්‍රොක්ලෝරොතයසයිඩ් සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) අංක 14,895 දරණ 1970 පෙබරවාරි මස 27 වැනි දිනැති "රජයේ ගැසට් පත්‍රයේ" පළ කොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කල වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රූ.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ. පෙ. 584, මහලේකම් කාර්යාලයේ " බී " කොටසේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970.9.18 දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙලද සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡෙදයේ iv වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර,කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

ඇන්. කේ. පී. විජේසිංහම,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

කොළඹ,
1970 ජුනි මස 6 දින.

## අදාල උපලේඛනය

| Item No. | Description | Estimated requirements | Packing required |
|---|---|---|---|
| 1 .. | Hydrochlorothazide B. P. 50 mgm. each OR Hydroflumethazide B. P. 50 mgm. | 2,000,000 tablets .. | In well closed bottles of 1,000 tablets |
| 2 .. | Diloximide Furate B. P. 0.5 gm. each .. .. | 400,000 tablets .. | In amber coloured bottles of 250 tablets |
| 3 .. | Diethylcarbamazine Citrate B. P. 50 mgm. each .. | 5,000,000 tablets .. | In bottles of 1,000 tablets |
| 4 .. | Standardised Senna .. .. .. | 2,800,000 tablets .. | In tins of 1,000 tablets |
| 5 .. | Theophylline with Ethylene Diamine (Amynophylline) B. P. 0.1 gramme | 5,200,000 tablets .. | In bottles of 1,000 tablets |
| 6 .. | Promazine Hydrochloride 25 mgm. each .. .. | 4,000,000 tablets .. | do. |
| 7 .. | Injection of Lignocaine Hydrochloride B. P. 2% in 20 cc. .. | 75,000 rubber capped Multidose vials | In boxes of 5 vials |
| 8 .. | Injection of Promethazine Hydrochloride each ampoule containing 2.5% W/V of Promethazine Hydrochloride B. P. | 50,000 × 1 ml. ampoules | In boxes of 25 ampoules |

6-386—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පිඑස්බී 11/70

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ග්ලිසරින් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ග්ලිසරින් සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) අංක 14,895 දරණ 1970 පෙබරවාරි මස 27 වැනි දිනැති ''රජයේ ගැසට් පත්‍රයේ'' පළ කොට ඇති නාමාවලියෙහි සඳහන් මා විසින් ලේඛනගත කල වෙළඳ සමාගම්;

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස.සෝ.රු.ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජනරජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර, කොළඹ, තැ. පෙ. 584, මහලේකම් කාර්යාලයේ " බී " කොටසේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970.10.6 දින පෙරවරු 10 තෙක් භාර ගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙළඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡෙදයේ iv වැනි උප ඡෙදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

ඇන්. කේ. පී. විජේසිංහම,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

කොළඹ,
1970 ජුනි මස 6 දින.

## අදාල උපලේඛනය

### SCHEDULE REFERRED TO

| Item | Description | Estimated requirements | Packing required |
|---|---|---|---|
| 1 .. | Glycerine B.P. .. .. | 11,200 lbs. by weight .. .. | In 1 cwt. drums |
| 2 .. | Liquid Hydrogen Peroxide B.P. 20 volume .. | 15,000 screw capped bottles packing of 20 fl. oz. each .. | In any convenient packing |
| 3 .. | Chlorohexylenol Solution B.P. .. | 2,000 Imperial gallons .. .. | In 1 gallon tins |

6-421—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

යොමුව : පීඑස්බී 25/70

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### පෙනෝල් සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පෙනෝල් සැපයීම සඳහා පහත සඳහන් උප ලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(i) අංක 14,895 දරණ 1970 පෙබරවාරි මස 27 වැනි දිනැති '' රජයේ ගැසට් පත්‍රයේ '' පළ කොට ඇති නාමාවලියෙහි සඳහා මා විසින් ලේඛනගත කල වෙළඳ සමාගම්,

(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්,

(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්,

(iv) ඔස්ට්‍රියාව, පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, මහජන චීන සමූහාණ්ඩුව, ස. සෝ. රු. ස., යුගෝස්ලේවියාව, එක්සත් අරාබි ජන රජය, බල්ගේරියාව, ජර්මානු ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය, හංගේරියාව හා රුමේනියාව.

2. සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ තැ. පෙ. 584 මහලේකම් කාර්යාලයේ '' බී '' කොටසේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1970.9.25 දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදල ටෙන්ඩර් ආකෘති කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින්ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛනගත කොට ඇති වෙලඳ සමාගම්වලටත්,

(ii) 1 වැනි ඡේදයේ iv වැනි උප ඡේදයේ සඳහන් රාජ්‍යයනට, ඔවුන්ගේ ලංකා නියෝජිතයින් මගිනුත් පමණකි.

4. ඉහත 2 වැනි ඡේදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිනීමට ඉඩ දෙනු ලැබේ.

5. මේ සම්බන්ධ වැඩි විස්තර කොළඹ 10 ඩීන්ස් පාරේ අංක 355 හි, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

කොළඹ,
1970 ජූනි මස 6 දින.

ඇන්. කේ. පී. විජේසිංහම්.
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

### අදල උපලේඛනය

| *Item No.* | | *Description* | *Estimated requirements* | | *Packing required* |
|---|---|---|---|---|---|
| 1 | .. | Phenol B. P. Ice Crystals in 40 lbs. tins to prepare 50 fl. lbs. Liq. Phenol .. | 17,000 lbs. | .. | In 40 lbs. tins |
| 2 | .. | Ext. Pro. Tinct. Rhei Co. B. P. 11,768 fl. lbs. of Tr. Rhei Co. in jars sufficient to prepare 500 fl. lbs. of Tr. Rhei Co. | 2,000 lbs. | .. | In any convenient packing |
| 3 | .. | Ext. Pro. Tinct. Card Co. B. P. to produce 10,929 gallons of Tincture .. | 17,000 lbs. | .. | In 10 fl. lbs. bottles |
| 4 | .. | Ext. Pro. Tinct. Gentian Co. B. P. to produce 33,342 fl. lbs. of Tincture Gentian Co. in jars each jar sufficient to prepare 500 fl. lbs. of Tinct Gentian Co. | 2,000 lbs. | .. | In any convenient packing |
| 5 | .. | Ext. Pro. Tinct. Zingib Fort B. P. to produce 30,775 fl. lbs. of Tinct. Zingib Fort | 1,000 lbs. | .. | In 10 fl. lbs. bottles |
| 6 | .. | Ext. Pro. Ext. Ipecac Liq. B. P. in 16 fl. ozs. bottles to produce 2,400fl. lbs. of Liq. Ext. Ipecac | 600 lbs. | .. | In 16 fl. oz. bottles |
| 7 | .. | Liq. Pro. Tinct. Hyociamy B.P. to produce 35,000 fl. lbs. of Tr. Hyociamy | 3,500 lbs. | .. | In 1/2 gallon winchester quarts bottles |

6–422—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1970 ඔක්තෝබර් පළමු වැනි දින සිට 1971 සැප්තැම්බර් 30 වනදයින් (දින දෙකක් ඇතුළුව) අවසන්වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උප ලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(1) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළයුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**— දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**— සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී, කොළඹ'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම, එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ කමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ ම විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛණයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර් කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙන් පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වළංගු කාල සීමාව.**— ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වළංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර් කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරී තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටු රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත්පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීති වලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

වෛද්‍ය. එච්. සී. ගෝමස්,
කොළඹ, සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
කොළඹ,
දිනය : 1970.6.8.

## උපලේඛනය 1970/71

| ආයතනය | ටෙන්ඩර් මුදල | ඇප මුදල | මසකට රෙදි සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු කැලි ගණන සාමාන්‍යයෙන් | ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|
| **1. උතුරු කොළඹ රෝහල, රාගම** | | | | | |
| **කොටස් අංක 1** | | | | | |
| වාට්ටු අංක 1, 3, 4, 6, 8, 9, 11, 12, 13, 14, 15, 16 මහලු වාට්ටු දෙකයි. ඕ.පී.ඩී. ඇක්ස්රේ රසායනාගාරය, මුළුතැන්ගෙය, හෙදි නිවාස, හෙදිපාලික නිවාස, කාර්යාලය, දන්ත චිකිත්සාගාරය, සමාජ රෝග චිකිත්සාගාරය, චිකිත්සාගාරය ගිලන් රථ, රෝහල, පොලීසිය, ඊ.සී.ජී. කාමරය ... ... ... | 100 ... | 400 ... | වාර 10 ... | 13,000 | |
| **කොටස් අංක 2** | | | | | |
| ළමා වාට්ටු අංක 2, 10 ... ... ... | 100 ... | 200 ... | දිනපතා ... | 1,900 | |
| **කොටස් අංක 3** | | | | | |
| මාතෘ වාට්ටු, ශල්‍යාගාරය, ප්‍රසූතිකාගාරය ... ... | 100 ... | 400 ... | දිනපතා ... | 12,500 | |
| **2. දකුණු කොළඹ රෝහල, කළුබෝවිල** | | | | | |
| **කොටස් අංක 1** | | | | | |
| ලේ බැංකුව, ඕ.පී.ඩී., මුළුතැන්ගෙය, හෙදි නිවාස, රසායනාගාර, ඩී.පී.ඇම්., ඇක්ස්රේ ඊ.ඇන්.ටී., ඊ.සී.ජී., දන්ත චිකිත්සාගාරය, වාට්ටු අංක 1, 2, 3, 4, 5, 7, 9, 11 ... ... | 100 ... | 500 ... | වාර 4 ... | 8,218 | |
| **කොටස් අංක 2** | | | | | |
| ශල්‍යාගාරය, වාට්ටු අංක 15ඒ, 14, 16, 17, 18 ... ... | 100 ... | 800 ... | දිනපතා ... | 20,018 | |
| **කොටස් අංක 3** | | | | | |
| වාට්ටු අංක 10, 12, 15බී ... ... ... | 100 ... | 200 ... | දිනපතා ... | 5,147 | 1970.7.9 දින පෙ.ව. 10 |
| **3. මොරටුව රෝහල** | | | | | |
| **කොටස් අංක 1** | | | | | |
| සාමාන්‍ය වාට්ටු අංක 1, 2, 3, 4, 6, 7, 9 ... ... | 100 ... | 200 ... | වාර 4 ... | 1,700 | |
| **කොටස් අංක 2** | | | | | |
| ළමා වාට්ටු සහ මාතෘ වාට්ටු අංක 5, 8 ... ... | 100 ... | 200 ... | වාර 10 ... | 500 | |
| **4. හෝමාගම රෝහල** | | | | | |
| **කොටස් අංක 1** | | | | | |
| වාට්ටු අංක 1,2 , 3, 4, 7 මුළුතැන්ගෙය, හෙදි නිවාස, කාර්යාලය, ඕ.ටී. | 100 ... | 200 ... | වාර 4 ... | 1,406 | |
| **කොටස් අංක 2** | | | | | |
| වාට්ටු අංක 5, 6, 8, 9 ... ... ... | 100 ... | 200 ... | වාර 10 ... | 1,944 | |
| **5. මීගමුව රෝහල** | | | | | |
| **කොටස් අංක 1** | | | | | |
| ශල්‍යාගාරය, ළමා මාතෘ සහ ගර්භනී වාට්ටු ... ... | 100 ... | 200 ... | දිනපතා ... | 3,467 | |
| **කොටස් අංක 2** | | | | | |
| වාට්ටු 1, 2, ශල්‍ය වාට්ටු 3, 4, 5 වෛද්‍ය වාට්ටු 9, භික්ෂු වාට්ටු, ස්ත්‍රී චිකිත්සාගාරය සහ කාර්යාලය ... ... | 100 ... | 200 ... | වාර 4 ... | 2,147 | |

6–420—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—ගාලු කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1970 ඔක්තෝබර් 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් 30 වනදයින් (දින දෙකක් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවන වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(i) මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල '' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර්පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම,එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරී/ලේකම් මහතාට (හෝ මා හට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීම හෝ මවිසින් බලය පවරන ලද නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙහි පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතුද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලසුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරීතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටි රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

1970 ජූනි මස 7 වෙනි දින,
ගාල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්‍යාලයේ දී ය.

බී. ජී. ඩී. ප්‍රනාන්දු,
සෞඛ්‍ය සේවා අධිකාරී, ගාල්ල.

### උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) මසකට සේදිය යුතු වාර ගණන | (5) මසකට සේදිය යුතු කෑලි ගණන (සාමාන්‍ය) | (6) ටෙන්ඩර් බාරගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| 1 වෙනි කොටස—සිහිකිරීමේ වාට්ටු 2, ශල්‍යාගාරය, වාට්ටු අංක 23 සිට 25, 28, 29, ළදරු වාට්ටු සහ තිඹිරිගෙය ... | 50 ... | 100 ... | දිනපතා ... | 18,000 | 70.7.22 වෙනි දින පෙරවරු 10 ට |
| 2 වෙනි කොටස—ඇක්ස්රේ සහ කායික වෛද්‍ය අංශයන්, ලේ බැංකුව, රෝග නිරෝධායන පරීක්ෂණාගාරය, රසායනාගාරය, මුළුතැන්ගෙය, පාලන අංශය, අනියම් ලෙඩුන්ගේ කාමරය, බාහිර රෝගීන්ගේ අංශය, දන්ත – ඇස් – කණ – නාසය – උගුර පිළිබඳ සහ වෙනත් චිකිත්සාගාර, රෝහල් හෙදි නිවාස, රෝහල් පොලිස් මුළුව, බෙහෙත් හල, වෙළුම් අංශය සහ ඕවර්සියර් තැනගේ කාමරය | 50 ... | 100 ... | 4 ... | 1,300 | |
| 3 වෙනි කොටස—වාට්ටු 1, 6 සිට 9, 11, 12 සහ රෝගීන් වෙන්කර තබන වාට්ටු ... ... | 50 ... | 100 ... | 4 ... | 1,000 | |
| 4 වෙනි කොටස—වාට්ටු අංක 2 සිට 5 සහ 14 සිට 19 ... | 50 ... | 100 ... | 10 ... | 3,600 | |
| 5 වෙනි කොටස—වාට්ටු 27 සහ තලාපිටිය මාතෘ නිවාසය ... | 50 ... | 100 ... | 10 ... | 1,000 | |
| 6 වෙනි කොටස—වාට්ටු 26 (ක්ෂය රෝග වාට්ටුව) 21, 22, සිහිකිරීමේ වාට්ටු 1 සහ ඕ.පී.ඩබලිව්. පිරිමි සහ ගැහැණු වාට්ටු ... ... ... | 50 ... | 100 ... | 4 ... | 1,100 | |

6–425—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා—වර්ෂ 1970 ඔක්තෝබර් 1 වන දින සිට 1971 සැප්තැම්බර් 30 වැනිද දක්වා (දින දෙකම ඇතුලත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර්පත්‍ර බදුල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයයේදී සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද, තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිළිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්‍යාලයයෙන් හෝ අනුරාධපුරය, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වවුනියා යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි වරුන්ගේ කාර්‍යාලවලින් ලබා ගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ආකෘති පත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට සැලකිය යුතු කාලයකට පෙර තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන් වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, බදුල්ල'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දයි පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම්ට භාරදෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙ. ව. 10ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්‍යාලයයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි''සී''උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොළේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

8. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම් කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කර ගත් දිනයක මවිසින් හෝ බලය පවරනු ලැබූ මාගේ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නාලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයේ 3 වැනි තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩාකර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

1970 ජූනි 8 වැනි දින,
බදුල්ලේ, සෞ. සේ. අධිකාරි කාර්‍යාලයේ දීය.

වෛ. වී. ඩී. ඩී. ද සිල්වා,
බදුල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

## උපලේඛනය

| (1) ආයතනය | | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට | | | | නොගෙවන ලෙඩුන්ට | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | මාලු | මස් | කරවල | එළවලු | මාලු | මස් | කරවල | එළවලු |
| | | රු. | රු. | | | | | | | | | |
| කොස්ලන්ද රෝහල | ... | 100... | 800 | 70.6.30 පෙ.ව.10.00 | 800... | 800... | 800... | 3,000... | 3,000... | 3,000... | 3,000... | 12,600 |
| මැටිගහතැන්න රෝහල | ... | 100... | 800 | | 400... | 400... | 450... | 1,800... | 1,500... | 1,500... | 1,400... | 5,900 |
| මහඔය රෝහල | ... | 100... | 700 | | 500... | 500... | 500... | 2,000... | 500... | 500... | 500... | 2,100 |
| මැදගම රෝහල | ... | 100... | 800 | | 300... | 300... | 300... | 1,200... | 1,500... | 1,600... | 1,500... | 6,400 |
| මීගහකිවුල රෝහල | ... | 100... | 800 | | 300... | 300... | 300... | 1,200... | 800... | 800... | 800... | 3,350 |
| සියඹලාන්ඩුව රෝහල | ... | 100... | 600 | | 100... | 100... | 100... | 500... | 900... | 900... | 900... | 4,200 |
| වැල්ලවාය රෝහල | ... | 100... | 800 | | 260... | 260... | 260... | 1,000... | 900... | 900... | 900... | 4,000 |
| හල්දුම්මුල්ල මා. නි. | ... | 100... | 400 | | 100... | 150... | 200... | 800... | 200... | 300... | 400... | 1,800 |
| වැවේගම මා. නි. | ... | 100... | 400 | | — ... | 150... | 250... | 500... | — ... | 200... | 400... | 800 |
| ඌරණිය මා. නි. | ... | 100... | 400 | | 300... | 300... | 300... | 1,200... | 800... | 800... | 800... | 3,500 |

හත්වනුවැ හොණ්ඩර 2ට වැඩියෙන් හොණ්ඩර 2½ දක්වාද
අටවනුවැ හොණ්ඩර 2½ට වැඩියෙන් හොණ්ඩර 3 දක්වාද,
නමවනුවැ හොණ්ඩර 3ට වැඩියෙන් හොණ්ඩර 3½ දක්වාද
දස වනුවැ හොණ්ඩර 3½ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වාද වේ.

එක් බඩු පොදියක් මුළු දුරමැ ගෙනැ යාම සඳහා එක් එක් බර—ගොල්ල උදෙසා මිල ගණන් දක්විය යුතුයි.

මුදල් ගෙවනු ලබන්නේ, ඉහත වැටි ක්‍රමයේ දක්වෙන බර කුමක් වුවද මුළු දුර ප්‍රමාණය මැ ගෙන යන ලද එක් එක් බඩු පොදි ගමන අනුවැයි.

(ආ) හොණ්ඩර 4ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුළු දුරමැ ගෙන යැම සඳහා මතු සඳහන් වැටි 4 යටතේ බී—II උපලේඛණයෙහි මිළ ගණන් දක්විය යුතු:—

1. හොණ්ඩර 4 කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා
2. හොණ්ඩර 10 කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා
3. හොණ්ඩර 15 කට වැඩියෙන් හොණ්ඩර 20 දක්වා
4. ටොන් 1 කට වැඩියෙන්.

ටෙන්ඩර්කරුවන් විසින් මුළු දුරමැ ගෙන යාම සඳහා ඒ ඒ වැටි යටතේ මිල ගණන් වෙන වෙනමැ දක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැටි 4 යටතේ මුළු දුරමැ සඳහා හොණ්ඩරයකට දක්වූ මිල ගණන මතැ අනු ප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56 කට වැඩි නම් එය හොණ්ඩරයක් සේ සැළකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

27. මේ දැන්වීම, මෙහි පහත ඉඩ තබා ඇති තැනෙහි ටැන්ඩර්කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයක් සමග කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි වෙත ආපසු එවිය යුතුයි.

වෛද්‍ය. එච්. සී. ගෝමස්,
1970.6.10 කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරී.

______________,
1970 ... නිකුත් කරන නිලධාරියාගේ අත්සන

______________,
1970 ... ටැන්ඩර්කරුගේ අත්සන.

## 1970-71 ට ගබඩා බඩු ඇදීම සඳහා ටෙන්ඩර් කොන්දේසිවල 24 වන ඡේදයේ කියැවෙන උප ලේඛණය

### කොළඹ කොට්ඨාශය

### 1 වෙනි කොටස වැල්ලවත්ත සිට මොරටුව දක්වා

| දුම්රිය පොළෙන්/පොළට දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ස්ථානයට | ආයතනවලින්/ආයතනවලට කායඞාලවලින්/කායඞාලවලට | කිට්ටුවෙන් සැලකිය හැකි දුර සැතපුම් |
|---|---|---|
| වැල්ලවත්ත ... | ශාන්ත පීටර් විදුහල ... | 1 |
| බම්බලපිටිය ... | විශාඛා විදුහල ... | 1 |
| දෙහිවල ... | දෙහිවල සෞ. වෛ. නි. ... | 1 |
| | දෙහිවල දන්ත චිකිත්සාගාරය ... | ¼ |
| | කළුබෝවිල රෝහල ... | 2 |
| රත්මලාන ... | රත්මලාන බෙහෙත් හල ... | 1 |
| | කැස්බෑව බෙහෙත් හල ... | 7 |
| | කොතලාවල පුර ද. චිකිත්සාගාර ... | 2 |
| මොරටුව ... | මොරටුව සෞ. වෛ. නි. ... | ½ |
| | මොරටුව රෝහල ... | 1 |
| | මොරටුව දන්ත චිකිත්සාගාරය ... | ½ |
| | වැකර මාතෘ නිවාසය ... | 9 |
| | කොරලවැල්ල බෙ. හ. ... | 2 |
| | පිළියන්දල මාතෘ නිවාසය ... | 6 |

### දෙවැනි කොටස—වෙයන්ගොඩ සිට අඹේපුස්ස දක්වා

| | | |
|---|---|---|
| වෙයන්ගොඩ ... | අලවල බෙ. හල ... | 11 |
| | තිහාරිය බෙ. හල ... | 4 |
| | වතුපිටිවල රෝහල ... | 5 |
| | දේවාලපොල බෙ. හල ... | 4 |
| | කලගෙඩිහේන මා. නි. ... | 3½ |
| | වෙයන්ගොඩ මා. නි. ... | ¼ |
| | ඌරාපොල බෙ. හල ... | 9 |
| | පස්යාල බෙ. හල ... | 6 |
| | නාඹුළුව මා. නි. ... | 8 |
| | කුරුවාමුල්ල ද. වි. ... | 10 |
| | ශාන්ත මරියා විදුහල ... | ¾ |
| | මහ විද්‍යාලය පස්යාල ... | 5 |

| දුම්රිය පොළෙන්/පොළට දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ස්ථානයට | ආයතනවලින්/ආයතනවලට කායඞාලවලින්/කායඞාලවලට | කිට්ටුවෙන් සැලකිය හැකි දුර සැතපුම් |
|---|---|---|
| පල්ලෙවෙල ... | පල්ලෙවෙල බෙ. හල ... | ¼ |
| | බෝකලගම මා. නි. ... | 5 |
| | මුද්දරගම බෙ. හල ... | 3½ |
| මීරිගම ... | දිවුලාපිටිය රෝහල ... | 9 |
| | කොටදෙනියාව බෙ. හල ... | 6½ |
| | මීරිගම රෝහල ... | 1½ |
| | මීරිගම සෞ. වෛ. නි. ... | 2½ |
| | වේවැල්දෙනිය බෙ. හ. ... | 4½ |
| | හල්පේ බෙ. හල ... | 3 |
| | මාලදෙනිය බෙ. හල ... | 4 |
| අඹේපුස්ස ... | අඹේපුස්ස ... | 1 |

### 3 වැනි කොටස—කැළණිය සිට බෙම්මුල්ල දක්වා

| | | |
|---|---|---|
| කැළණිය ... | බියගම මා. නි. ... | 8 |
| | කැළණිය රෝහල ... | 3 |
| | කැළණිය සෞ. වෛ. නි. ... | 4 |
| | පැලියගොඩ බෙ. හල ... | 3 |
| | සේදවත්ත බෙ. හල ... | 1 |
| | සිංහාරමුල්ල බෙ. හල ... | 2 |
| | කැළණිය විද්‍යාලය ... | 2½ |
| | සේදවත්ත ම. විද්‍යාල ... | 3 |
| | පැලියගොඩ ද. වි. ... | 1½ |
| | හපුගස්කන්ද ද. වි. ... | 5 |
| හුණුපිටිය ... | හැඳල ලාදුරු රෝහල ... | 2½ |
| | හැඳල බෙ. හල ... | 3 |
| | හුණුපිටිය බෙ. හල ... | ¾ |
| | උස්වැටකෙයියාව | — |
| රාගම ... | කඩවත බෙ. හල ... | 3 |
| | රාගම ලය රෝහල ... | 1 |
| | රාගම උ. කො. රෝ. ... | ½ |
| | කලගොල්ල ... | 1 |
| | වැලිසර රෝහල ... | 1¾ |
| ගනේමුල්ල ... | ගනේමුල්ල බෙ. හල ... | ½ |
| ගම්පහ ... | දෙම්පේ රෝහල ... | 16 |
| | ගම්පහ සෞ. වෛ. නි. ... | ¾ |
| | ගම්පහ රෝහල ... | 1 |
| | රදවාන රෝහල ... | 11 |
| | අනුරගොඩ ... | 15 |
| | මිනුවන්ගොඩ රෝහල ... | 7 |
| | මිනුවන්ගොඩ සෞ. වෛ. කා. ... | 6 |
| | අනුර විද්‍යාලය ... | 12 |
| | වැලිවේරිය බෙ. හල ... | 5 |
| | උඩුපිල බෙ. හල ... | 8 |
| | මල්වතුහිරිපිටිය බෙ. හල ... | 7 |
| | කිරිඳිවෙල සෞ. වෛ. නි. ... | 13 |
| | කොරුස්ස බෙ. හල ... | 5 |
| | හේනේගම ද. වි. ... | 6½ |
| | මාදෙල්ගමුව බෙ. හල ... | 4½ |
| | රත්නාවලී විද්‍යාලය ... | ¼ |
| | උඩුගම්පල ද. වි. ... | 3 |
| බෙම්මුල්ල ... | බෙම්මුල්ල මා. නි. ... | 1 |

### 4 වෙනි කොටස—කඳන සිට කොච්චිකඩේ දක්වා

| | | |
|---|---|---|
| කඳාන ... | කඳාන ලය රෝහල ... | 1½ |
| ජාඇල ... | ජාඇල රෝහල ... | ½ |
| | ජාඇල සෞ. වෛ. නි. ... | ½ |
| | බෝපිටිය කුමාර විද්‍යාලය ... | 4 |
| | පමුණුගම බෙ. හල ... | 5 |
| සීදුව ... | සීදුව බෙ. හල ... | ¾ |
| මීගමුව ... | මීගමුව සෞ. වෛ. නි. ... | 1 |
| | මීගමුව රෝහල ... | 1 |
| | හල්පේ බෙ. හල ... | 7 |
| | බඩල්ගම බෙ. හල ... | 13½ |
| | පිටිපන බෙ. හල ... | 3 |
| | කලාහේන මා. නි. ... | 7 |
| | ආඩිඅම්බලම බෙ. හල ... | 7 |
| | හරිස්චන්ද්‍ර විද්‍යාලය ... | 1 |
| | දූනගහ මා. නි. ... | 10 |
| | පිටිපන ද. වි. ... | 3½ |

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 ජූලි මස 9 වෙනි දින ප.ව. 2.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර පොළොන්නරුව අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ :—

| පාසැලේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. පො/මින්නේරිය මහ විද්‍යාලය ... | වහල නැවත තැනීම හා ගොඩනැගිලි අලුත් වැඩියා කිරීම. |
| 2. පො/හිඟුරක්ගොඩ ගුරු විද්‍යාලය | ගොඩනැගිලි හා විද්‍යාල්පති නිවාස අලුත් වැඩියා කිරීම. |
| 3. පො/කිරිමැටිදමන විද්‍යාලය ... | ළිඳ ඉදි කිරීම. |

සංලක්ෂ්‍යය.—පො=පොළොන්නරුව දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ පොළොන්නරුව අධ්‍යාපන කාර්යාලයේ හෝ එක් වැඩක් සඳහා රු. 100 බැගින් මුදල් තැන්පත් කර එම කුවිතාන්සිය පොළොන්නරුව අධ්‍යාපන නිලධාරි වෙත ඉදිරිපත් කිරීමෙන් පහත සඳහන් මුදල්වලට හෝ ඊට වැඩි මුදලකට හෝ අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 ජූලි මස 8 දින පෙරවරු 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 ට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසු සෝ නොවෙත්.) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ පොළොන්නරුව අධ්‍යාපන කාර්යාලයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියා පදිංචිය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණි.

**අවශ්‍ය ලියාපදිංචිය :** අංක 1. රු. 18,000, අංක 2. රු. 10,000, අංක 3. රු. 5,000.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර්පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන්, දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියා පදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර දෙවැනි හා තුන්වැනි ඡේදවල සඳහන් පරිදි පොළොන්නරුව අධ්‍යාපන කාර්යාලයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද ලබාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපැලෙන්, පොළොන්නරුව අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලි ලෙස ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පෞද්ගලිකව පොළොන්නරුව අධ්‍යාපන කාර්යාලයේ ප්‍රධාන ලිපිකරු වෙත භාර දිය යුතුයි.

5. 1970 ජූලි මස 9 දින පස්වරු 2.30 ට අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කළ මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමැති විය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තරයක් වේනොත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තැනගේ කාර්යාලයෙන් දැනගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 1969.6.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

කා. සෝ. පලිහක්කාර,
ප්‍රධාන අධ්‍යාපන නිලධාරී,
පොළොන්නරුව.

1970 ජූනි මස 7 දින,
පොළොන්නරුව අධ්‍යාපන කාර්යාලයේදී ය.

6–394—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 ජූලි මස 9 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 10 වනතෙක් මෙහි පහත සඳහන් වන වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | | වැඩයේ ස්වභාවය |
|---|---|---|
| 1. හලා/පාදෙනිය වි. | ... | පාසැල් ගොඩනැගිල්ල |
| 2. හලා/පූකුලම වි. (පුත්තලම මණ්ඩලය) | ... | පාසැල් ගොඩනැගිල්ල |
| 3. හලා/කරගස්වැව වි. | ... | වහල අලුත්වැඩියාව |

සංලක්ෂ්‍යය : හලා=හලාවත දිස්ත්‍රික්කය.

2. හලාවතින් බැහැර ඕනෑම කච්චේරියක හෝ හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන්

අංක 1 වැඩවලට රු. 20,000 හා ඊට වැඩි ගණනකට
අංක 2 වැඩවලට රු. 17,000 හා ඊට වැඩි ගණනකට
අංක 3 වැඩවලට රු. 9,000 හා ඊට වැඩි ගණනකටද

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාතීමේන්තුවේ හෝ වාරිමාගී දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 ජූලි මස 8 වැනි බදාදා ප. ව. 3 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාගී දෙපාතීමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චැක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාතීමේන්තුවේ සෝ වාරිමාගී දෙපාතීමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍යවේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කල යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපැලෙන් හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නො එවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව හලාවත අධ්‍යාපන කාර්යාලයේ ප්‍රධාන ලිපිකාර වෙත භාර දිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 ජූලි මස 9 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 10.30 ට හලාවත ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාරගැනීම අවසන්කල දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමතිවිය යුතුයි.

6. ටැන්ඩර් බාර ගැනීම අවසාන වූ විට ටැන්ඩර් විවෘත කරනු ලැබේ. ටැන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටැන්ඩර්කරුවන් පැමිණ සිටිය යුතුය.

7. ටැන්ඩරය බාර ගන්නා ලද බව ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබ දින 10 ක් ඇතුළත යම් කෙනෙකු ගිවිසුමට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළොත් හෝ අත්සන් කිරීමට අසමත් වුවහොත් එසේ නැතහොත් අනුමත කරන ලද ඇප මුදල බැඳීමට අසමත් වුවහොත් ටැන්ඩර් තැන්පතුව රාජසන්තක කරනු ලැබේ.

8. පිළිගනු ලැබූ කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවීමේදී සේවයට ගත යුත්තේ පුහුණු හා නුපුහුණු ලාංකික කම්කරුවන් පමණක් වන අතර, හැකිතාක් දුරට එම කම්කරුවන් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම බඳවා ගත යුතුය.

9. පිළිගනු ලැබූ ටැන්ඩර්කරුට ගිවිසුමක් අත්සන් කිරීමටත්, ටැන්ඩරයේ සඳහන් මුදලින් සියේට 5 ක් ඇප වශයෙන් යාපනය දිසාපති වෙත තැන්පත් කිරීමටත් එම ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් මාස තුන (3) ක් ඇතුළත වැඩ අවසන් කර බාර දීමටත් නියම වනු ඇත.

10. වැඩ පිළිබඳ වෙනත් අවශ්‍ය විස්තර ඇතොත් යාපනය දිසාපතිගෙන් ලබාගත හැකිය.

11. පැහැර හැරි කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවේ නම් සඳහන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටැන්ඩර් බාර ගනු නොලැබේ.

12. ප්‍රශ්නයෙන් තොරව, කිසියම් ටෙන්ඩරයක් හෝ සියලු ටැන්ඩර හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ බාර ගැනීමේ අයිතිය දිසාපති තබා ගනී.

13. ටැන්ඩර්කරුවන් තමන් ඉදිරිපත් කරන ගණන්, ටැන්ඩර් විවෘත කරනු ලබන දිනයේ සිට මාසයක් විවෘතව තැබිය යුතුය.

කේ. පොන්නම්බලම්,
යාපනය දිසාපති වෙනුවට.

1970 මැයි මස 2 වැනි දින,
යාපනයේ මහා ලේකම් කාර්යාලයේ
ඉඩම් කාර්යාලයේ දී ය.

6–392—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## රත්නපුර කච්චේරිය

**රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර සහනාධාර සඳහා ඔරු අඟුල් සැපයීම**

රත්නපුර දිස්ත්‍රික්කයේ පහත සඳහන් ග්‍රාම සේවක කොට්ඨාශ වලට ඔරු අඟුල් හතක් සැපයීම පිණිස 1970 ජූලි මස 8 වැනි බදාදා පස්වරු 2.30 වන තෙක් රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ටැන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. රජයේ දෙපාර්තමේන්තුවල රු. 15,000 හෝ ඊට වැඩි මුදලකට කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී සිටින අයට හෝ ග්‍රාම සංවර්ධන සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ වඩු කර්මාන්ත සමිති වලට 1970 ජූලි මස 4 සෙනසුරාදා දවල් 12 වන තෙක් රත්නපුර දිසාපති කාර්යාලයයේ දී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයන් විසින් දිසාපති කාර්යාලය යේ දී මේ වැඩ වෙනුවෙන් රු. 25 ක මුදලක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සියක් රත්නපුර දිසාපති කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ. යථෝක්ත සමිති විසින් මෙම මුදල තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාර ගනු නො ලැබේ.

4. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කොට අනුපිටපතක් ද සමග ලේඛන ගත තැපෑලෙන් එවිය යුතු ය. සීල් තබන ලද ටෙන්ඩරය බහා එවන කවරයේ උඩ වම් කෙලවරේ, ටෙන්ඩර්කරුගේ නම ද, ලිපිනය ද, වැඩෙහි නම ද ලියා තිබිය යුතු ය. ටෙන්ඩර්පත්‍ර තැපෑලෙන් නො එවන්නේ නම් රත්නපුර දිසාපති කාර්යාලයයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතු ය.

5. 1970 ජූලි මස 8 වැනි බදාදා පස්වරු 2.30ට මෙම දිසාපති කාර්යාලයේදී දී ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන් ගේ නියෝජිතවරුන්ට හෝ පැමිණ සිටිය හැක.

6. ටෙන්ඩර්කරුවන් මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟ විය යුතු යි.

7. වැඩි විස්තර රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති ගෙන් ලබාගත හැක.

කුසුමා විලේගොඩ,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1970 ජූනි මස 7 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේ දී ය.

**ඔරු අඟුල් අවශ්‍ය ග්‍රාම සේවක කොට්ඨාශ**

| | | |
|---|---|---|
| 1. | ඇලපාත වසම සඳහා ඔරු අඟුල් ... | ... 2 යි. |
| 2. | හංගමුව වසම සඳහා ඔරු අඟුල් ... | ... 1 යි. |
| 3. | තෙප්පනාව වසම සඳහා ඔරු අඟුල් | ... 2 යි. |
| 4. | රද්දැල්ල වසම සඳහා ඔරු අඟුල් ... | ... 1 යි. |
| 5. | ගලතුර වසම සඳහා ඔරු අඟුල් ... | ... 1 යි. |

6–395—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : 327/441.

## ඉඩම් කොමසාරිස් දෙපාතීමේන්තුව

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1970 ජූලි 13 වෙනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ :—

| වැඩයේ ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල |
|---|---|
| 1. පොල්ගහවෙල ප්‍රා. ආ. නි කොට්ඨාශයේ දඹගොල්ල කොළනි පාර ... | රු. 50,000 |
| 2. ඊඳල්ල කොළනි පාර ... | රු. 50,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට කොන්ත්‍රාත්කරුවන් වශයෙන් රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති අයට 1970 ජූලි මස 7 වෙනි දින දහවල් 10.30 වන තෙක් කුරුණෑගල දිසාපති කාර්යාලයේ දී ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් කුරුණෑගල දිසාපති කාර්යාලයේ අදාළ වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් කුරුණෑගල දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද, වැඩය සඳහා මුදල් ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දැනට වැඩවල නිරතව සිටින ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට මෙකී වැඩය සඳහා ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ හැකිය. ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවීම අනුමත කරන ලද සමිති නිදහස් ය. එහෙත්, ඉහත සඳහන් මුදල් ප්‍රමාණයට ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු පමණක් ඒවාට ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර, පිටපත් දෙකකින් යුතුව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම්, ගාලු මුවදොර, මහ ලේකම් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය.

5. 1970 ජූලි මාසයේ 13 වෙනි දින පස්වරු 2.30 ට ඉහත කී අංක 357 දරණ කාමරයේදී ටෙන්ඩර් පෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමන්ගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියකින් දැන් වූ පසු දින 10 ක් ඇතුළත ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට හා ඇප තැබීමට අපොහොසත් වුවහොත් ඔහු විසින් ටෙන්ඩර් පෝර්මය සඳහා තැන්පත් කරන ලද මුදල් රාජසන්තක කරනු ලැබේ.

7. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට පුහුණු නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟවිය යුතු අතර, ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩ කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

8. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු කුරුණෑගල දිසාපතිගෙන් දැනගත හැකිය.

ඇස්. අමරසිංහ,
කුරුණෑගල දිසාපති වෙනුවට.

1970 ජූනි 18 වෙනි දින,
කුරුණෑගල දිසාපති කාර්යාලයේ දී ය.

6–429—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## රත්නපුර කච්චේරිය

### ආර්ථික හා සමාජ සංවර්ධන මණ්ඩලය මගින් ගංවතුරෙන් අනාථ වූවන් සඳහා ප්‍රජා මණ්ඩල ශාලාවක් තැනීම

රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න කෝරළයේ ගංවතුරෙන් අනාථ වූවන් පදිංචි කරවීම සඳහා එම කෝරළයේ කැල්ල වසමේ යෝජිත ජනපද ඉඩමේ ප්‍රජා මණ්ඩල ශාලාවක් තැනීම සඳහා 1970 ජූලි මස 8 වැනි බදාදා අප්වරු 2 වන තෙක් රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. රජයේ දෙපාර්තමේන්තුවල රුපියල් 30,000 ක් හෝ ඊට වැඩි මුදලක් සඳහා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී සිටින අයට හෝ ග්‍රාම සංවර්ධන සමිති, විවිධ සේවා සමූපකාර සමිති හෝ වඩු කර්මාන්ත සමිති වලට 1970 ජූලි මස 4 වැනි සෙනසුරාදා පෙරවරු 10 වන තෙක් රත්නපුර දිසාපති කාර්යාලයේ දී ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝරම අපේක්ෂකයින් විසින් දිසාපති කාර්යාලයේ දී මේ වැඩ වෙනුවෙන් රුපියල් 100 ක මුදලක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සියක් දිසාපති කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. යථෝක්ත සමිති විසින් මෙම මුදල තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැ ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කොට අනු පිටපතක් ද සමග ලේඛන ගත තැපෑලෙන් එවිය යුතුය. සීල් තබන ලද ටෙන්ඩරය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම ද, ලිපිනය ද, වැඩෙහි නම ද ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් නො එවන්නේ නම්, රත්නපුර දිසාපති කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැක.

5. 1970 ජූලි මස 8 වැනි බදාදා පස්වරු 2 ට මෙම දිසාපති කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතවරුන්ට හෝ පැමිණ සිටිය හැක.

6. ටෙන්ඩර්කරුවන් මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟ විය යුතුයි.

7. වැඩි විස්තර රත්නපුර දිසාපති කාර්යාලයේ සමාජ සේවා අංශ යෙන් ලබා ගත හැක.

කුසුමා විලේගොඩ,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1970 ජූනි මස 6 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේ දීය.

6–345—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ටෙන්ඩර් දැන්වීම

වාලච්චේනෙයි නැගෙනහිර කඩදාසි කම්හලට මෙහි පහත සඳහන් දෑ සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවේ :—

1. හයිඩ්‍රොක්ලෝරික් අම්ල ටොන් 500.
අවසාන දිනය 1970 අගෝස්තු 20.

2. සල්ෆර් දිග ටොන් 400.
අවසාන දිනය 1970 අගෝස්තු 29.

ටෙන්ඩර් ආකෘතිපත් හා අනිකුත් විස්තර, මූලිකයන්ගේ/සැපයුම් කරුවන්ගේ නම් හා ලිපිනයන් සඳහන් කර අයැද ලබාගත හැක.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස,
කොළඹ 2,
1970 ජූනි 2 දින.

6–435/1—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

මෙහි පහත දක්වෙන දෑ මෙම සංයුක්ත මණ්ඩලයට සැපයීම සඳහා ලියාපදිංචි වීමට අදහස් කරන මෙරට සැපයුම් කරුවන්ගේ අයැදුම් 1970.7.1 දිනදී හෝ ඊට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් සාමාන්‍යාධිකාරී වෙතට එවිය යුතුයි :—

1. ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ.
2. මුද්‍රණ ආකෘතිපත් ආදිය.
3. ආවුධ හා නල ආදිය ඇතුළත් ලෝහ භාණ්ඩ.
4. මෝටර් හා යන්ත්‍ර අමතර කොටස්.
5. ටයර්, ටියුබ් හා බැටරි.
6. රසායන ද්‍රව්‍ය.
7. විදුලි උපකරණ.
8. කාර්යාල හා නිවාස ලී බඩු.
9. රෙදි (තුවා, තිර හා කලාල ආදිය).
10. බෙහෙත් ආදිය.
11. සායම්, පොළොව ඔපදමන දෑ, වාර්නිෂ් ආදිය.
12. නිල ඇඳුම් මැසීම ආදිය.
13. දැව.
14. විවිධ ද්‍රව්‍ය.

එක් ද්‍රව්‍යයකට වැඩියෙන් සැපයීම සඳහා අදහස් කරන අය ඒ සඳහා වෙන වෙන අයැදුම්පත් එවිය යුතුයි. සාමාන්‍යයෙන් මිල ගණන් කැඳවනුයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවෙන් වුවද, අනිකුත් සැපයුම්කරුවන් වෙතින් කැඳවීමේ අයිතිය සංයුක්ත මණ්ඩලය සතුවේ. මිල ගණන් කැඳවීමේදී අනුකූලතාවය නොදක්වන හෝ, මිල ගණන් දැක්වීමෙන් පසු සැපයීමට අපොහොසත් වන අයගේ නම් සැපයුම්කරුවන්ගේ ලැයිස්තුවෙන් කපා හරිනු ඇත.

කාර්යාල වේලාවන් තුළදී මෙම කාර්යාලයෙන් අයදුම්පත් ලබා ගත හැක.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස,
කොළඹ 2,
1970 ජූනි 2 දින.

6–435/2—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

බදුල්ලේ පොලිස් අධිකාරී නිවාසයේ වහල අළුත්වැඩියා කිරීම සඳහා වූ ටෙන්ඩර් පත්, නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරු කාර්යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් වර්ෂ 1970 ජූලි මස 8 වැනි බදාදා පෙරවරු 11.00 වනතෙක් භාරගනු ලැබේ.

2. බදුල්ල ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු වරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර් පත් පිළියෙලකොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්ම වල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 9,500 කට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු වරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 ජූනි මස 27 වැනි සෙනසුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රුපියල් 10 බැගින් ආපසු ගෙවනු නොලැබෙන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

4. ටෙන්ඩර් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කල යුතුවේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කල හැක.

ජී. ඩී. සමරසූරිය,
නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු,
ගොඩනැගිලි.

අධිකාරි ඉංජිනේරු කාර්යාලය,
නැගෙනහිර කොට්ඨාශය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
බදුල්ල.

6–450—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

තින්නාවූර්හි පිහිටි වෛද්‍ය නිලධාරිගේ නිවාසයේ සහ ඇඳන් 12 ක වාට්ටුවේ ඉතිරි වැඩ සඳහා වූ ටෙන්ඩර්පත්, බදුල්ල ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති වරයා විසින් වර්ෂ 1970 ක් වූ ජූලි මස 15 වැනි දින පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

කල්මුනේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු වරයාගෙන් ලබාගත් ආකෘති පත්වල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර සැලැස්ම වල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට හැකිය.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 17,000 කට නො අඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු වරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 ක් වූ ජූනි මස 27 වැනි සෙනසුරාදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසු වනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රුපියල් 10 බැගින් ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

4. ටෙන්ඩර් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරිස්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් ලබාගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘතිපත්‍ර නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක දී හෝ තැන්පත් කළ හැක.

ජී. බී. සමරසූරිය,
නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි,
ඉංජිනේරු-ගොඩනැගිලි.

නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු,
(ගොඩනැගිලි) කාර්යාලය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
බදුල්ල, 1970 ජූනි 8 දින.

6–449–70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

මහව පොලිස්ථානයට ගැලුම් 1000 ක ඉහලින් පිහිටි ටැංකියක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මංඩලයේ සභාපතිවරයා විසින් 1970 ක්වූ ජූලි මස 14 අඟහරුවාදා පෙ.ව. 10.30 වන තෙක් භාරගනු ලැබේ.

කුරුණෑගල/ගො/දෙහි දිස්ත්‍රික් ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටැන්ඩර් පත් පිළියෙළකොට අනුපිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර, සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදි බලාගැනීමට හැකිය.

ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 5,800 නොඅඩු ගණනකට ලියා පදිංචිවූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත්කර ලබාගත් කුවිතාන්සිය 1970 ජූනි මස 30 අඟහරුවාදා ප. ව. 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් ලබා ගැනීමට සුදුස්සන් වනවා ඇත. ටෙන්ඩර් පත් ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 ක් බැගින් වූ අපසු නොගෙවනු ලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරියාට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුය.

ටෙන්ඩර් පත් නිකුත් කිරීමට පෙර අයදුකරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කල යුතුය.

ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තුවන අය ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී ඇතට කරගෙන යන වැඩ පිළිබඳ සියලුම විස්තර අඩංගු කළ යුතු ආකෘති පත්‍ර නිකුත් කරණ නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මංඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

සී. යෝගරාජා,
ගොඩනැගිලි අධ්‍යක්ෂ,
මධ්‍යම කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු (ගො)

අධිකාරි ඉංජිනේරු කාර්යාලය,
මධ්‍යම කොට්ඨාශය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
මහනුවර.
70. 6. 7 වැනි දින.

6–469—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**පරණ ප්‍රවෘත්තිපත්‍ර හා පරණ ගැසට්පත්‍ර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

1970 ජූනි මස 28 දින පූ. භා. 10.30 ට කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හතරවෙනි මහලේදී පරණ ප්‍රවෘත්තිපත්‍ර රාත්තල් 200 ක් පමණ හා පරණ ගැසට්පත්‍ර රාත්තල් 100 ක් පමණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේවා ඉතාම වැඩි මිලට ඉල්ලුම් කරන තැනැත්තාට ලබාගත හැකිය. ඉල්ලුම් කර ලබාගත් තැනැත්තා ඒ වේලාවේම මුදල් ගෙවා එකී පත්‍ර හා ගැසට් පත්‍ර රැගෙන යා යුතුය.

මෙම පරණ ප්‍රවෘත්තිපත්‍ර හා ගැසට්පත්‍රිකා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන දින උදේ 9.30 සිට 10 දක්වා පරීක්ෂා කර බැලීම සඳහා අපේක්ෂකයන්ට ඉඩ සලසා ඇත.

පී. කාසිලිංගම්,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

1970 ක්වූ ජූනි මස 8 දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 7.

6–427—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

**පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

1970.5.29 දිනැති අංක 14,908 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 731 වැනි පිටුවේ සඳහන් ගැසට් නිවේදනය සම්බන්ධවයි. වෙන්දේසිය පැවැත්වෙන දිනය එහි දැක්වෙන පරිදි 70.6.14 දින නොව 70.7.6 දින පෙරවරු 10 ට යනුවෙන් නිවැරදි විය යුතුයි.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

ධීවර දෙපාර්තමේන්තුව,
ගාළු මුවදොර,
කොළඹ 3,
1970 ජූනි මස 7 දින දිය.

6–391—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ ටී 2 විකිණීම් ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1970 ජූනි මස 30 වෙනි දින පෙ. ව. 10 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1970 ජූනි මස 29 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

ඇන්. ඒ. සන්දසෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඞී/විකිණීම්/23.
1970 ජූනි මස 9 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1 යි.
2. කපු නූල් කාටූන් 34 යි.
3. නූල් පෙට්ටි 7 යි.
4. යන්ත්‍රෝපකරණ පෙට්ටි (බෝල්ට් සහ ඇණ) පෙට්ටි 1 යි.
5. යන්ත්‍ර ආම්පන්න පෙට්ටි 1 යි.
6. ටයර් 2 යි.
7. ටයර් 1 යි.
8. රසායන ද්‍රව්‍ය පෙට්ටි 1 යි. (බෝතල් 2 ක්)
9. විදුලි උපකරණ පෙට්ටි 2 යි.
10. මුද්‍රිත ෆෝර්ම පෙට්ටි 1 යි.
11. ටෙට්රොන් පැසින් රෙදි පෙට්ටි 2 යි.
12. පිඟියා පෙට්ටි 2 යි.
13. නූල් පෙට්ටි 1 යි.
14. විදුලි භාණ්ඩ පෙට්ටි 1 යි.
15. මුද්‍රිත පොතත් (ශු. බයිබල්) කාටූන් 20 යි.
16. බ්‍රවුන් පේපර් පෙට්ටි 1 යි.
17. ටියුබ් පෙට්ටි 2 යි (ගුඩ් ඉයර් ලොකු ප්‍රමාණයේ)
18. දැත්වීම් පුවරු පෙට්ටි 1 යි.
19. නූල් පෙට්ටි 1 යි.
20. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1 යි. (කෑලි 10 යි)
21. ටෙට්රෝන් පැසින් රෙදි පෙට්ටි 2 යි.
22. මුද්‍රිත පින්තූර පෙට්ටි 1 යි.
23. නූල් පෙට්ටි 1 යි.
24. මුද්‍රිත ද්‍රව්‍ය පෙට්ටි 1 යි.
25. හිස් ටින් පෙට්ටි 1 යි.
26. පෑන් බෙල්ට්ස් පෙට්ටි 14 යි.
27. මුද්‍රිත පොත් පෙට්ටි 1 යි.
28. මුද්‍රිත ද්‍රව්‍ය පෙට්ටි 16. (ක්‍රීඩා භාණ්ඩ සඳහා වැසුම්)
29. රසායනාගාර උපකරණ කාටූන් 1 යි.
30. කඩදාසි රෝල් 5 යි. (කුඩා ප්‍රමාණයේ)
31. කඩදාසි රෝල් 23 යි.
32. භූමිතෙල් වීදුරු ලාම්පු 32 යි.
33. ටින් ටැක්ස් පෙට්ටි 1 යි. (ඇමිණුම් ඇත)
34. පැට්‍රෝලියම් ඇස්පල්ට් රූපින් රෝල් 1 යි.
35. පැට්‍රෝලියම් ඇස්පල්ට් රූපින් රෝල් 5 යි.
36. නූල් පෙට්ටි 12 යි.
37. ටයර් 4 යි.
38. ටයර් 4 යි.
39. කියත් තල පෙට් ටි1 යි.

6–434 –70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## 1970–71 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා 1970 මාර්තු මස 20 වැනි දින අංක 14,898 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රා තැබෑරුම් රේන්ද කොන්දේසිවලට හා සෑම සුරාබදු බලපත්‍රයකට අදල එවකට වලංගුව පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත විස්තර දක්වෙන රා තැබෑරුම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඇප මුදල් වෙනුවෙන් රු. 3,000 ක් ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් සමග සෑම ටෙන්ඩරයක්ම ඕනෑම කච්චේරියකින් ලබාගත් නියමිත ටෙන්ඩර්පත්‍ර ෆෝර්මයක ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර්කරුගේ ඉඩම්කඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරීතැනගෙන් ලබාගත් වත්කම් සහතිකයක් හෝ එයට විකල්පයක් වශයෙන් විශ්වාස සහතික ඔප්පුවක් (Fidelity Guarantee Bond) ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රයට අමුණා තිබිය යුතුයි. එම වත්කම් සහතිකය හෝ විශ්වාස සහතික ඔප්පුවේ සඳහන් වටිනාකම තමා ටෙන්ඩරය ඉල්ලුම් කරන මුදලෙන් සියයට 25 කට වඩා අඩු නොවිය යුතුයි.

4. වත්කම් ඇහවෙන සහතිකයට ගැනෙන දේපල සහතිකය ලබාගත් පසු විකිණීම හෝ වෙනත් අන්දමකින් අයිතිය වෙනස් කිරීම රේන්දයේ කොන්ත්‍රාත්තුව දෙන ගිවිසුමේ කොන්දේසිය කඩකිරීමක් හැටියට සලකනු ලැබේ.

5. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතු අතර, නියෝජිතයකු මගින් හෝ ලාංකික නොවූ හෝ 1970.3.20 අංක 14,898 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ 6 වැනි කොන්දේසිය යටතේ නුසුදුසු වූවන්ගෙන් ටෙන්ඩර්පත්‍ර භාරගනු නොලැබේ.

6. තැබෑරුම වෙනුවෙන් එක් අයෙකුට එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා ඉදිරිපත් කළ නොහැකි වන අතර, පස් දෙනෙකුට වඩා හවුල්වද ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ නොහැක.

7. සෑම ටෙන්ඩරයක්ම කවරයක බහා සීල් තබා කවරය වම්පස මුදුනේ ''කළුතර දිස්ත්‍රික්කයේ අංක 1 දරන රා තැබෑරුමේ ටෙන්ඩරය—1970–71'' යනුවෙන් පැහැදිලි ලෙස සටහන් කළ යුතුය. ටෙන්ඩර් සහිත කවර (අ) දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීම හෝ 1970.7.4 වැනි දින පෙරවරු 11 ට පෙර ඉදිරිපත් කළ යුතුය. එම වේලාවට සියලුම ටෙන්ඩර්කරුවන් කළුතර කච්චේරියට පැමිණ සිටිය යුතුය. මෙහි 5 වැනි ඡෙදයේ සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ 6 වැනි කොන්දේසිය යටතේ නුසුදුසු අයකු නොවන බව ඔප්පු කිරීමට අවශ්‍ය වුවහොත් එය සනාථ කිරීමේ ලියවිලිද රැගෙන පැමිණ සිටිය යුතුය.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර්පත්‍ර පිළිගත් බව දන්වූ වහාම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසින් ඇප තැන්පත් මුදල වශයෙන් නියම කරනු ලබන මුදලක්ද ගෙවිය යුතුයි.

9. ටෙන්ඩර්පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර්පත්‍ර කිසිම හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත වෙත පැවරී ඇත. විකිණීමේ කොන්දේසිවලට අනුකූල නොවූ හෝ වෙනයම් අන්දමකින් නිසි පරිදි සකස් නොවූ හෝ ටෙන්ඩර්පත්‍ර භාරගනු නොලැබේ.

10. වැඩි විස්තර කළුතර දිසාපති කාර්යාලයෙන් ලබාගත හැක.

ලීල් ගුණසේකර,
කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 ජූනි මස 7 වැනි දින,
කළුතර දිසාපති කාර්යාලයේදී ය.

### 1970–71 වර්ෂයට කළුතර දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම්

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | ග්‍රාමය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාව |
|---|---|---|---|---|---|
| 1 | ... අළුත්ගම් සුළු නගර සභා ප්‍රදේශය | ... අළුත්ගම සුළු නගර සභා සීමාව තුළ | ... පෙ.ව. 8.00 | ... ප.ව. 7.30 | ... පෙ.ව. 11.00 |

සැලකිය යුතුයි.—1970–71 වර්ෂයට දනට තැබෑරුම පිහිටා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. අළුත් ස්ථානයක තැබෑරුමක් විවෘත කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපතිගෙන් අනුමැතිය ලබා ගත යුතුය.

6–423 —70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

## බදුල්ල දිස්ත්‍රික්කයේ 1970–71 වර්ෂයේ රා තැබෑරම් විකිණීම

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති බදුල්ල දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළදී ගැනීම සඳහා 1970 මාර්තු මස 20 වැනි දින අංක 14,898 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1970–71 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡෙදයන් සඳහා රා රේන්ද විකිණීමේ කොන්දේසිවලට ද, දැනට බලපවත්නා සියලු සුරාබදු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව 1970 ජූලි මස 13 වන දින තෙක් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

2. රා රේන්ද මිළදී ගැනීමට ඉදිරිපත් වන අය ලංකාවේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි ආකාර සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුමේ ලැයිස්තුවෙහි නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් කච්චේරි කුවිතාන්සියද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකයක්ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය හා නමද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි පහත දැක්වෙන ටෙන්ඩර්පත් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමෙන් හෝ මෙම කච්චේරියේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් දිසාපතිතුමා වෙත ලැබීමට සැලැස්විය යුතුයි.

3. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරණු ලබන සෑම වෙනස් කිරීමක්ම හෝ සංශෝධනයක් ම ටෙන්ඩර් කරුගේ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුයි. එසේ නොවන ටෙන්ඩර්පත්‍ර භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 1970 ජූලි මස 13 වැනි දින පෙරවරු 9.30ට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම කච්චේරියේ පෙනී සිටිය යුතුයි.

5. කිසියම් කරුණක් සඳහන් නොකොට, ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති තුමා සතුවේ.

6. ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත්කළ අය, ඔහු ගැනුම්කරු වශයෙන් ප්‍රකාශිත දින සවස 4ට පෙර දිසාපති තුමා විසින් නියම කරනු ලබන මාස දෙකකට නොඅඩු කාලයක බදු මුදලක් තැන්පත් ඇප වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් තැබිය යුතුයි.

7. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමේදි දැනගතයුතු වෙනස් විස්තර ඇත්නම් බදුල්ල කච්චේරියෙන් ලබාගත යුතුයි.

ඩබ්. තිලකරත්න.
අතිරේක දිසාපති,
බදුල්ල දිසාවේ දිසාපති වෙනුවට.

1970 ජුනි මස 7 වෙනි දින,
බදුල්ල දිසාපති කාර්යාලයේදී ය.

ඉහතකී තැබෑරුම්වල උපලේඛනය

### 1970–71 වර්ෂය සඳහා අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව, බදුල්ල දිස්ත්‍රික්කය

| තැබෑරුමේ අංකය සහ නම | කොට්ඨාශය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාශය | තැබෑරුම විවෘත කරන වේලාව පෙරවරු | තැබෑරුම වසන වේලාව පස්වරු | ටෙන්ඩර් තැන්පත් මුදල | ටෙන්ඩර් පත් භාරගැනීමේ අවසන් කරන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|
| 1. බදුල්ල ... | බදුල්ල මහ නගර සභාව | බදුල්ල මහ නගර සභාවේ අංක 6 දරන කොට්ඨාශයේ සීමාව තුළ හුණුකොටුව නමැති රජයට අයත් ඉඩමේ | 8.00 ... | 7.30 | ...රු. 1,000 ... | 1970.7.13 වැනි දින පෙ.ව 10.00ට |
| 2. ලුනුගල ... | පස්සර ... | ලුනුගල නගරයේ පිහිටි වරිපනම් අංක 219 දරණ කුරුවිකුඹුරේවත්ත. | 8.00 ... | 7.30 | ...රු. 500 ... | 1970.7.13 වැනි දින පෙ.ව. 10.30ට |

බදුල්ල දිස්ත්‍රික්කයේ වතු සුරා සැල් (රා) ලැයිස්තුව (ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකළ යුතුයි)

1. මඩුල්සීම—මහදෝව වත්තේ සීමාව තුළ
2. ලුනුගල—කෙහෙල්වත්ත වතුයාය සීමාව තුළ
3. කලිපොතැන්න—කලිපොතැන්න වතුයාය තුළ

} 1970–71 වර්ෂය සඳහා අළුත්වැඩියා කිරීමට මෙම වතුඅධිකාරින් ඔවුන්ගේ නිර්දේශය 1970.7.13 දිනට පෙර මා වෙත එවිය යුතුයි.

6–431—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

---

## 1970–71 වර්ෂයේ රා තැබෑරුම් විකිණීම—මොණරාගල දිස්ත්‍රික්කය

**කාල සීමාව.**—1970 ඔක්තෝබර් 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 දින දක්වා.

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 දින දක්වා වූ කාල සීමාව තුළ පහත සඳහන් ස්ථානයේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා 1970 මාර්තු මස 20 දින අංක 14,898 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහන් රා තැබෑරුම් වෙන්දේසි පිළිබඳ කොන්දේසිවලට හා දැනට බලපවත්වන සියළුම සුරාබදු කොන්දේසිවලට යටත්ව ම විසින් බාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ඕනෑම දිසාපති කාර්යාලයකින් ලබාගත් නියමිත ආකෘති පත්‍රිකාවක් විය යුතු අතර, සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 1,000 ක් බාරගත් බවට නිකුත් කරන ලද කච්චේරි කුවිතාන්සියක් අමුණා තිබිය යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රයට සම්බන්ධ තැබෑරුමේ නම ද, අනුමත තැබෑරුම් ලැයිස්තුවේ දක්වා ඇති එහි අංකයද, පැහැදිලිව ලියා කච්චේරියේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහා ලිය යුතුයි. නැතහොත් ටෙන්ඩර් වැසීමට නියමිත වේලාවට පෙර ලැබෙන සේ මොණරාගල දිසාපති නමට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

4. සියළුම ටෙන්ඩර්පත් බාර ගැනීම 1970 ජූලි මස 12 දින පෙ. ව. 10 ට වසනු ලැබේ. ටෙන්ඩර්කරුවන් එම වේලාවට මොණරාගල කච්චේරියේ පෙනී සිටිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය, ඔහු ගැනුම්කරු වශයෙන් ප්‍රකාශිත දින ප.ව. 4.00 පෙර තැබෑරුම් පිළිබඳ කොන්දේසි වලට අත්සන් තබා දිසාපති විසින් නියම කරනු ලබන මාස දෙකකට නොඅඩු කාලයක බදු මුදල් තැන්පත් ඇප වශයෙන් දිසාපති වෙත ගෙවිය යුතුය.

6. කිසියම් කාරණයක් සඳහන් නොකර එවන ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ සියල්ලම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති සතු වේ.

7. වැඩි මනත් විස්තර මොණරාගල කච්චේරියෙන් ඉල්ලා සිටි විට, ලබාගත හැක.

පී. ජී. පුංචිහේවා,
මොණරාගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1970 ජුනි මස 8 දින,
මොණරාගල, දිසාපති කාර්යාලයේදිය.

### අනුමත තැබෑරුම් ලැයිස්තුව—මොණරාගල දිස්ත්‍රික්කය, 1970–71

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම් පිහිටුවිය යුතු ග්‍රාමය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව |
|---|---|---|---|---|
| 1 ... | මොණරාගල ... | පල්ලෙවරාදෙල හා ගමේවෙල ඇතුළත ... | පෙ. ව. 8.00 ... | ප.ව. 6.30 |

6–499—70.6.18 දින අංක 14,911 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ, මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුයි.**

## උපලේඛනය

**1970**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| **ජූනි** | ... | 70. 6. 5 සිකුරාද | ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... | 70. 6 11 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| **ජූලි** | ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද | ... | 70. 6.25 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | | 70 7 10 සිකුරාද | ... | 70 7 2 බ්‍රහස්පතින්ද | පෙ ව | 12 0 |
| | | 70. 7.17 සිකුරාද | ... | 70. 7.10 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | | 70. 7.24 සිකුරාද | ... | 70. 7.17 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | | 70. 7.31 සිකුරාද | ... | 70. 7.24 සිකුරාද | පෙ.ව. | 12.0 |
| **අගෝස්තු** | ... | 70. 8. 7 සිකුරාද | ... | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 8.14 සිකුරාද | ... | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.21 සිකුරාද | ... | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.28 සිකුරාද | ... | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| **සැප්තැම්බර්** | ... | 70. 9. 4 සිකුරාද | ... | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.11 සිකුරාද | ... | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.18 සිකුරාද | ... | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.25 සිකුරාද | ... | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| **ඔක්තෝබර්** | ... | 70.10. 2 සිකුරාද | ... | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10. 9 සිකුරාද | ... | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.16 සිකුරාද | ... | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.23 සිකුරාද | ... | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.30 සිකුරාද | ... | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| **නොවැම්බර්** | ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | ... | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.11.12 බ්‍රහස්පතින්ද | ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | | 70.11.20 සිකුරාද | ... | 70.11.12 බ්‍රහස්පතින්ද | පෙ.ව. | 12.0 |
| | | 70.11.27 සිකුරාද | ... | 70.11.20 සිකුරාද | පෙ.ව. | 12.0 |
| **දෙසැම්බර්** | ... | 70.12. 4 සිකුරාද | ... | 70.11.27 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | | 70.12.11 සිකුරාද | ... | 70.12. 4 සිකුරාද | පෙ.ව. | 12.0 |
| | | 70.12.18 සිකුරාද | ... | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.24 බ්‍රහස්පතින්ද | ... | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.31 බ්‍රහස්පතින්ද | ... | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.



ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී